**ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන්**
**2022.11.10 දින පෙ.ව.09ඃ30 ට දොම්පෙ ප්‍රාදේශිය සභාවේ කිරිදිවැල සභා රැස්වීම් ශාලාවේදි**
**පැවති දොම්පෙ ප්‍රාදේශිය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාව.**

පැමිණීමඃ-

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඃ-

| | | |
|---|---|---|
| 01. | පියසේන කාරියප්පෙරුම මහතා | ගරු සභාපති |
| 02. | අජිත් සිසිර කුමාර මහතා | ගරු උපසභාපති |
| 03. | ජේ.ඒ.සනී ජයවර්ධන මහතා | ගරු මන්ත්‍රී |
| 04. | ගාමිණී නිහාල් විජේරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 05. | ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා | ගරු මන්ත්‍රී |
| 06. | වයි.ඒ.සරත් ගාමිණී මහතා | ගරු මන්ත්‍රී |
| 07. | බී.එස්.අයි. දයාසුන්දර මහතා | ගරු මන්ත්‍රී |
| 08. | චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 09. | එස්.එම්.රාජා ලක්ෂ්මන් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ජගත් සිරිලාල් අතුකෝරල මහතා | ගරු මන්ත්‍රී |
| 11. | කේ.ඒ. කරුණාජීව මහතා | ගරු මන්ත්‍රී |
| 12. | දනුෂ්ක සාලින්ද දේශප්‍රිය මහතා | ගරු මන්ත්‍රී |
| 13 | එස්.එම්.රත්නසිරිලාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | උපාලි නිශාන්ත අනුරජිත් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | විත්‍රානන්ද ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 16. | ලෙස්ලි ගුණරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | දුමාල් මධුසංක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ජානක පුෂ්ප කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 19 | අජන්ත රෝහිණී මිය | ගරු මන්ත්‍රී |
| 20 | ලලිත් වසන්ත පීරිස් මහතා | ගරු මන්ත්‍රී |
| 21. | ඩබ්.පී.ගංගා කුමාරි ජයවර්ධන මිය | ගරු මන්ත්‍රිනි |
| 22 | ඩබ්.එල්. ඥානවතී මිය | ගරු මන්ත්‍රිනි |

එක්සත් ජාතික පක්ෂයඃ-

| | | |
|---|---|---|
| 01. | උභය කුමාර ජයවර්ධන මහතා | ගරු විපක්ෂනායක |
| 02. | මලින්ද ගුණරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 03. | නීල් ද ඩග්ලස් සමරකෝන් මහතා | ගරු මන්ත්‍රී |
| 04. | දමිත් ප්‍රියශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 05. | ප්‍රසාදිනී රේණුකා කාරියවසම් මිය | ගරු මන්ත්‍රිනි |
| 06. | එස්.ඒ. පද්මිණී සමරසේකර මිය | ගරු මන්ත්‍රිනි |
| 07. | සමීර මාගම්මන මහතා | ගරු මන්ත්‍රී |
| 08. | නදීකා ප්‍රියංගනී මිය | ගරු මන්ත්‍රී |
| 09. | රුවනි දමයන්ති තිසේරා මිය | ගරු මන්ත්‍රිනි |

ශ්‍රීලංකා නිදහස් පක්ෂය ඃ-

| | | |
|---|---|---|
| 01. | ආර්.ජී.එම්.ඩී.අමින්ද රෝහිත මහතා | ගරු මන්ත්‍රී |
| 02. | බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා | ගරු මන්ත්‍රී |

ජනතා විමුක්ති පෙරමුණ ඃ-

| | | |
|---|---|---|
| 01. | ඩී. සමන්ත රංජන් මහතා | ගරු මන්ත්‍රී |
| 02. | දිමුතු ප්‍රදීප් පල්ලෙවෙල මහතා | ගරු මන්ත්‍රී |

<u>සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්</u> ඃ-

| | | |
|---|---|---|
| 01. | තාරක අබේවික්‍රම මහතා | ගරු මන්ත්‍රී |
| 02 | නදීකා සඳරුවනි තෙන්නකෝන් මිය | ගරු මන්ත්‍රීනී |
| 03 | ඩබ්ලිව්. සුදර්මි මිය | ගරු මන්ත්‍රීනී |
| 04. | පුෂ්ප කුමාර රත්නායක මහතා | ගරු මන්ත්‍රී |
| 05. | එස්.ඒ.ඩී.වික්‍රමරත්න මිය | ගරු මන්ත්‍රීනී |
| 06 | එල්.ඒ.මධුර සංජීව අතුකෝරල මහතා | ගරු මන්ත්‍රී |
| 07 | ධම්මිකා මානෙල් රාමනායන මිය | ගරු මන්ත්‍රීනී |
| 08. | කුමාර සෝමසිංහ මහතා | ගරු මන්ත්‍රී |

(අ) පසුගිය සභා රැස්වීම් වාර්තා සභා සම්මත කිරීම

1. 2022.10.13. දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

<u>ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, 2022.10.13 දින දොම්පෙ ප්‍රාදේශීය සභාවේ පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සභාව පිළිගැනීම සුදුසු බව මම යෝජනා කරනවා.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා විසින් ස්ථිර කරන ලදී.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන

- නැත -

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

01. ගරු මන්ත්‍රී තාරක අබේවික්‍රම මහතා
02. ගරු මන්ත්‍රීනී නදීකා සඳරුවනි තෙන්නකෝන් මිය
03. ගරු මන්ත්‍රීනී ඩබ්ලිව්. සුදර්මි මිය
04. ගරු මන්ත්‍රී පුෂ්ප කුමාර රත්නායක මහතා
05. ගරු මන්ත්‍රීනී එස්.ඒ.ඩී.වික්‍රමරත්න මිය
06. ගරු මන්ත්‍රී එල්.ඒ.මධුර සංජීව අතුකෝරල මහතා
07. ගරු මන්ත්‍රීනී ධම්මිකා මානෙල් රාමනායන මිය
08. ගරු මන්ත්‍රී කුමාර සෝමසිංහ මහතා

ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් සහ ගරු මන්ත්‍රීතුමියන් අසනීප නිසා සහ හදිසි අවශ්‍යතා නිසා අද දින සභා රැස්වීමට නොපැමිණෙන බව දන්වා ඇති හෙයින් එම අයහට නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කිරීමෙන් ඒකමතිකව සභා සම්මත විය.

(ඈ) සංදේශ, පෙත්සම් ,පැමිණිලි ඉදිරිපත් කිරීම.

(ඉ) යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න

-නැත -

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

**ඊ) 01. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශිය සභාවේ ක්‍රියාත්මක වැඩ ඒකකයේ කටයුතු 2023.01.02 සිට 2023.06.30 දින දක්වා දීර්ඝ කර පවත්වාගෙන යාම සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව පිළිගැනීම සහ එම ව්‍යාපෘති වාර්තාව මෙම යෝජනාවේම කොටසක් ලෙස සලකා කටයුතු කිරීමටත් අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් (බ.ප.) වෙත යැවීමත් සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් සිරිලාල් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 02. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශිය සභාවේ ක්‍රියාත්මක ඩෙංගු ඒකකයේ කටයුතු 2023.01.02 සිට 2023.06.30 දින දක්වා දීර්ඝ කර පවත්වාගෙන යාම සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව පිළිගැනීම සහ එම ව්‍යාපෘති වාර්තාව මෙම යෝජනාවේම කොටසක් ලෙස සලකා කටයුතු කිරීමටත් අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් (බ.ප.) වෙත යැවීමත් සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් සිරිලාල් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)</u>

**ගරු සභාපතිතුමනි, අපේ මේ ඩෙංගු එකෙන් කිරිදිවැල නගරයේ මදුරුවන් බෝවීම සහ කාණු පද්ධතිය ගැන වැඩි අවධානයක් යොමු කරන්න. ගොඩනැගිලිවල කුණු කාණු වලට හරවලා වහින කාලයට පුදුම දුගඳක් එනවා.ඩෙංගු මදුරුවන්ගෙන් මිනිසුන්ට වන පීඩනය අවම කරන්න ඔබතුමා කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා.**

**ඊ) 03. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන පෙරපාසල් ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කාලය 2023.01.02 දින සිට 2023.06.30 දක්වා මාස 06 කින් ඉදිරියට දීර්ඝ කිරීමටත්, ඒ සඳහා සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව මෙම යෝජනාවේම කොටසක් ලෙස සලකා කටයුතු කිරීමටත්, ඊට අදාළ අනුමැතිය ලබා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස් (බ.ප.) වෙත යොමු කිරිමත් සුදුසු බව මම යෝජනා කරමි.

**එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 04. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**2022.11.10** දින මහා සභාවේ න්‍යායපත්‍ර අංක (ඊ) 05. යටතේ සභා සම්මත වි ඇති පරිදි මහසභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව මම මෙම ගරු සභාවට යොජනා කරමි. (ඒ අනුව **2022.11.10** දින දක්වා මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් ඇමුණුම් අංක **01** යටතේ ඉදිරිපත් කර ඇත.)

<u>ගරු මන්ත්‍රී නිල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මෙහි අංක **35** යටතේ වතුරුගම ප්‍රජාශාලාවට කැන්දගසක් කඩා වැටීම හේතුවෙන් කැඩී ගිය තහඩු වෙනුවෙන් අලුතින් තහඩු **5** ක් මිලදී ගැනීම.මේ වතුරුගම ප්‍රජාශාලාව කියන්නේ අපේ කොට්ඨාශයේ වතුරුගමද,

මෙය කැන්දහේන රදාවානේ කියා සංශෝධනය කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී. සමන්ත රංජන් මහතා (ජ.වි.පෙ.)</u>
ගරු සභාපතිතුමනි, අංක **03** යටතේ මාලිගාවත්ත ක්‍රීඩාංගනයේ අනාරක්ෂිත කාණුව තාවකාලිකව වසා දැමීම සඳහා ඉටිකොළ අඩි **175** ක් මිලදී ගැනීමට ර.**18000**/-යි. මේ මහජන ක්‍රීඩාංගනයේ ව්‍යාපෘතිය තවම නිමාවෙලා නැහැ. මෙහි අංක **77** යටතේ **10%** රැඳවුම් මුදල නිදහස් කරනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>
ගරු මන්ත්‍රීමනි, දිග ඝනකම් පොලිතින් එක දිගටම එලලා වැහුවා. ව්‍යාපෘතිය හරි. කාණුව බැඳීමටයි මුදල් වෙන්කර තිබෙන්නේ. ඇස්තමේන්තුව හැටියට වැඩයකර තිබෙනවා. කාණුව බැඳපු එක නිසි පරිදි තිබෙනවා. **10%** ගෙවනවා.

<u>ගරු මන්ත්‍රී නිල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි,අංක **03** අඩි **175** කට ර.**18000**/- කියා තිබෙන්නේ. එවිට අඩියක් රු.**103**/- වෙනවා. එවිට කිලෝ එකට වැටෙන්වන් අඩි **10** ක් විතර. එවිට රු.**1000** ක් විතර වෙනවා. කඩයක සාමාන්‍යයෙන් ඉටි කොළ කිලෝ **01** ක් රු.**500** ක් විතර.

එය මීටර් කියා සංශෝධනය කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදී.

ඉහත සංශෝධනවලට යටත්ව මහසභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 05. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශිය සභාවේ වැඩ අධිකාරි ලෙස කටයුතු කරන ටී.ඒ.යු.සිසිර කුමාර මහතා **2022.12.31** දින විශ්‍රාම යාමට නියමිත අතර ඒ අනුව මම සභාවට තාක්ෂණ නිලධාරි **1** පන්තියේ තනතුරක් පුරප්පාඩු වන බැවින් සභාවේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී ගැටළුකාරි තත්වයකට මුහුන දීමට සිදුවන නිසා එම මහතාගේ සේවය එක් වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත ලබාගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යොජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 06. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

2022 කියවීමේ මාසයට සමගාමීව කිරිදිවැල මහජන පුස්තකාලය මගින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් ඒ සඳහා වන රු.21250/- ක් වු වියදම් ඇස්තමේන්තුව පිළිගැනීමත් සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. 3,4,5 ශ්‍රේණි දරුවන් සඳහා "ඔරිගමි "වැඩසටහන සඳහා | | - රු.8000.00 |
| ❖ සම්පත්දායක දීමනාව | - 5000.00 | |
| ❖ සම්පත්දායකයින් සඳහා සංග්‍රහ | - 1500.00 | |
| ❖ ඡායාරූප සඳහා | - 1000.00 | |
| ❖ වෙනත් වියදම් | - 500.00 | |
| | 8000.00 | |
| 2. කතන්දර පැය වැඩසටහන සඳහා | - | රු.9750.00 |
| ❖ සම්පත්දායක ත්‍යාගය | - 2500.00 | |
| ❖ දරුවන් සඳහා කතන්දර පොත් 250/-x25 | - 6250.00 | |
| ❖ ඡායාරූප සඳහා | - 1000.00 | |
| | 9750.00 | |
| 3. ස්වයංරැකියාවට අත්වැලක් බිම්මල් වගාකිරීම | | - රු.3500.00 |
| ❖ සම්පත්දායක ත්‍යාගය | - 2500.00 | |
| ❖ ඡායාරූප සඳහා | - 1000.00 | |
| | 3500.00 | |
| **මුළු වියදම** | | **රු.21250.00** |

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් සිරිලාල් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදි.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 07. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

පහත සඳහන් ටෙන්ඩර් මණ්ඩල කමිටු රැස්වීම් වාර්තා පිළිගැනීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි .(වාර්තා ඇමුණුම් අංක 02 යටතේ ඉදිරිපත් කරන ලදී)

1. 2022.10.25 දින පැවති ටෙන්ඩර් මණ්ඩල කමිටු රැස්වීම් වාර්තාව
2. 2022.11.08 දින පැවති ටෙන්ඩර් මණ්ඩල කමිටු රැස්වීම් වාර්තාව

එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදි.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 08. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධානයන්ට අනුව 2022 නොවැම්බර් 30 දිනට පෙර වරිපනම් බදු නොගෙවන බදුකරුවන් සඳහා විධානය කරනු ලබන මෙම කාල සීමාව සඳහා නොගෙවන්නන්ගේ දේපළ තහනමට ගැනීමට සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය  මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 09. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

දොම්පෙ ප්‍රාදේශිය සභාවේ කොන්ත්‍රාත් පදනම මත වැඩ ඒකකයේ සේවය කරන ලබන සේවක මහතුන් 06 දෙනෙකු 2022-10-04 දින රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරකට ලක්වීම මත රෝහල් ගතකරන ලදී. එකී සේවක මහතුන් අතරින් නීලක ප්‍රසන්න මහතා තවදුරටත් වෛද්‍ය ප්‍රතිකාර ලබන බැවින් නොපැමිණ සිටින දින ගණනට පමණක් දින 28 කට උපරිමයකට යටත්ව දෛනික වැටුපක් ප්‍රාදේශිය සභාව මගින් ගෙවීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර  මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 10. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 යටතේ රාජ්‍ය වියදම් පාලනය කිරීම අරමුනු කොට ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටවූ බැවින් ඒ වනවිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.PL/7/10/7 - තාව අංක හා ජනතා හිතකාමී කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන මහජන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම ශීර්ෂයෙන් යුතුව එවා ඇති ලිපියට අනුකූලව 2022.10.06 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව(බස්නාහිර පළාත) LGD/7/රාජ්‍ය වියදම් අංක දරණ ලිපිය මගින් තවදුරටත් ආපදාවට පත් මාර්ග පිළිසකර කිරීමට අනුමැතිය ලබාදී ඇත. නමුත් නවතන ලද අවස්ථාවේ තිබූ මිලගණන් අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අපහසු බැවින් සංශෝධනය කරන ලද මිලගණන් අනුව  නැවත ඇස්තමේන්තු සකසා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න  මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ)11 ගරු ,** සභාපති, පියසේන කාරියප්පෙරුම මහතා යෙ ාජනා කරයි,

2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලය ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 46 අනුව ලේකම් විසින් පත්කළ යුතුව ඇති අතර, කඩිනමින් සමීක්ෂණය සිදු කිරිමට සමීක්ෂණ මණ්ඩල හයක් (06 ) සඳහා සභිකවරුන් හත් දෙනෙකු (07) , පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිළධාරින් තිදෙනෙකු (03) සහ සභාවේ නිළධාරින් තිස්දෙනකු (30) ඇතුලත් වන සේ ලේකම් මහතා විසින් පත් කරන ලද පහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩල 06 2022-12-31 දිනට භාණ්ඩ සමීක්ෂණය සඳහා පිළිගැනීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි'

**01.ප්‍රධාන කාර්යාලය, වැකේ/ පූගොඩ/ දොම්පෙ/ කැරගල උපකාර්යාල වල ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය**

| | | |
|---|---|---|
| 01.කළමනාකරණ සෙවා නිළධාරි | - ඒම්.ඒම්.ආර් .චන්ද්‍ර සේකර මිය | - සමික්ෂණ මණ්ඩල සභාපති |
| .02ගරු ප්‍රා.සභා. මන්ත්‍රී | - ගාමිණී නිහල් විජේරත්න මහතා | - සමික්ෂණමණ්ඩල සාමාජික |
| .03ජ්‍යෝ .ප්‍රජා සංවර්ධන නිළධාරි | -ජී.ජී ජයතිස්ස මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| **04**.කළමනාකරණ සෙවා නිළධාරි | - එච්.ඒ.එස්.එන්.හපුආරච්චි මිය | **-** සමික්ෂණ මණ්ඩල සාමාජික |

**.02**වැකේ/ පූගොඩ/ දොම්පෙ /කැරගල උපකාර්යාල වලට අදාල ආයුර්වේද **පුස්තකාල,** හා පෙරපාසල් වල ඉන්වෙන්ට්‍රි **භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය**

| | | |
|---|---|---|
| .01කළමනාකරණ සහකාර | - ඩබ්.එස්.එන්. ඒන් තිසේරා මිය | -සමික්ෂණ මණ්ඩල සභාපති |
| .02ගරු ප්‍රා.සභා.මන්ත්‍රී | - රාජු බුත්පිටිය මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| .03ජ්‍යෝ.ප්‍රජා සංවර්ධන නිළධාරි | - ජී.ජී ජයතිස්ස මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| **04 .** සංවර්ධන නිළධාරි | - ඒන්. වික්‍රමසිංහ මිය | සමික්ෂණ මණ්ඩල සාමාජික |

03. වැකේ/ පූගොඩ දොම්පෙ/ කැරගල මහජන පුස්තකාල හා එයට අනුබද්ධ ග්‍රාමීය පුස්තකාල පොත් සමීක්ෂණ මණ්ඩලය

| | | |
|---|---|---|
| 01 සංවර්ධන නිළධාරි | - කේ.ඩී.මධූෂා ගයන්ති මිය | - සමික්ෂණ මණ්ඩල සභාපති |
| 02. ගරු ප්‍ර.සභා. මන්ත්‍රී | - වයි.ඒ. සරත් ගාමිණී මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 03. ගරු ප්‍රා.සභා.මන්ත්‍රී | - මලින්ද ගුණරත්න මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 04 පුස්තකාලයාධිපති | - ජේ.එම්.ටී.එස්.ජයමාන්න මිය | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 05. සංවර්ධන නිළධාරි | -.ආර්.ඒච්.ඩබ්.කෙ.ඒරන්දිකා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 06. පුස්තකාලයාධිපති | - ආර්.ඩබ්.එම්.ප්‍රින්සි කුමාරි මිය | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 07. වෙළඳසැල් පරිපාලක | - මධූෂිකා මුණසිංහ මෙනවිය | - සමික්ෂණ මණ්ඩල සමාජික |
| 08. සංවර්ධන නිළධාරි | - ඒම්.ඒම්.ජේ කරුණාරත්න මිය - | සමික්ෂණ මණ්ඩල සමාජික |
| 09 **.**කළ.සෙaවා නිළධාරි | -එම්.ආර්.ඒ.එච්.යූ.ප්‍රියදර්ශනී මිය | - සමික්ෂණ මණ්ඩල සමාජික |
| 10. සංවර්ධන නිළධාරි | -තෙ.ඒස්.තනුෂ්කා මිය | - සමික්ෂණ මණ්ඩල සමාජික |

**04.**ආයුර්වේද තොග සමීක්ෂණය මණ්ඩලය

| | | |
|---|---|---|
| 01. කළමනාකරණ සෙවා නිළධාරි | - නෙල්කා කරුණානායක මිය | - සමික්ෂණ මණ්ඩල සභාපති |
| 02.ගරුප්‍රාස. මන්ත්‍රී | - කේ.ඒ. කරුණාජීව මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 03.කළමනාකරණ සෙවා නිළධාරි | - ඊ.පී.ප්‍රියන්තා එදිරිසිංහ මිය | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 04.සංවර්ධන සහකාර | - යූ. මර්සි මියුරින් මිය | - සමික්ෂණ මණ්ඩල සාමාජික |
| 05.තාක්ෂණ නිළධාරි, කැරගල | -ටී.ඒස්.ඒම්.බණ්ඩාර මැණි ෙක් මිය | -සමික්ෂණ මණ්ඩල සාමාජික |

**05.** වත්කම් සමික්ෂණ මණ්ඩල

| | | |
|---|---|---|
| 01 .තාක්ෂණ නිළධාරි, පූගොඩ | - **බී.ටී.විජයන්ති මිය** | සමික්ෂණ මණ්ඩල සභාපති |
| 02. ගරු ප්‍රාස. මන්ත්‍රී | - සාලින්ද දේශප්‍රිය මහතා | - සමික්ෂණ මණ්ඩල සාමාජික |

| | | |
|---|---|---|
| 03. කළ.සේවා නිළධාරි | **- චන්දිමා කෝනාර මිය** | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 04. ප්‍රධාන කළ. සේවා නිළධාරි | - ඩබ්.ඒන්.ජයවර්ධන මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 05. කළමනාකරණ සහකාර | - ඊ.ඒ.ඩී.කේ.චන්ද්‍රිකා මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 06.තාක්ෂණ නිළධාරී,වැකේ | - ආර්.ඒ.ඩී.පාලිත කමලසිරි මයා | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 07. තාක්ෂණ නිළධාරී | - ඩබ්.ටී.එස්.විජේසිංහ මිය | -සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 08.සංවර්ධන නිලධාරී | -ආනන්දි බාලසූරිය මිය | -සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 09. තාක්ෂණ නිළධාරී (සැලසුම්) | - වැකේ - එච්.පී.ජී.වී.පතිරණ මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |

**06. ගබඩා සමීක්ෂණ මණ්ඩලය**

| | | |
|---|---|---|
| 01. කළ.සේවා නිළධාරි | - කමණි චන්දිකා මිය | - සමීක්ෂණ මණ්ඩල සභාපති |
| 02 කළ.සේවා නිළධාරි | -ඒල්.ඒල්.ඒස්.කේ.පෙරෙරා | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 03. .ගරු ප්‍රා.ස. මන්ත්‍රී | -අමින්ද රෝහිත මහතා- | -සමීක්ෂණමණ්ඩල සාමාජික |
| 04.කළ. සේවා නිළධාරි | -ඇන් ප්‍රියන්ගනී මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 05.සංවර්ධන නිලධාරි | -අර්.ඒම්.පී.ඩී.කරුණාරත්න | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 06 සංවර්ධන නිලධාරි | -ඒච්.අර්.ටී.පී.රත්නසෙකර | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 07.සංවර්ධන නිලධාරි- | -.ඩී.ඒම්.සී.ඒම්.වීරකෝන් | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 08.කළ. සේවා නිළධාරි | - අරුණි නිරෝෂණි මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 09.සංවර්ධන නිලධාරි | -ඩී.ඒච්.අයි.ප්‍රියදර්ශනී මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |
| 10. කළ. සේවා නිළධාරි | -රම්‍යා සුදර්ශනී මිය | - සමීක්ෂණ මණ්ඩල සාමාජික |

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 12. ගරු මන්ත්‍රී දිමුතු ප්‍රදීප් පල්ලෙවල මහතා යෝජනා කරයි ඃ-**

**2022 මන්ත්‍රී යෝජනා**

**<u>මුල් යෝජනාව</u> ඃ-**

- ගනේකන්ද ආනදොල මාර්ගයේ කරුනාවතී මහත්මියගේ නිවස අසල පාර - **200000.00**

**<u>සංශෝධිත යෝජනාව ඃ-</u>**

- හරංකහපත මහා හේන මාර්ගයේ නියදගල ළිද අසල පාර - **200000.00**

**එම යෝජනාව ගරු මන්ත්‍රී සමන්ත රංජන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

ඊ) 13. ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා යෝජනා කරයි ඃ-

2022 මන්ත්‍රී යෝජනා

මුල් යෝජනාව ඃ-

- මේරිලන්ඩ් ග්‍රාම නිලධාරි වසමේ පෙරපාසල් ගොඩනැගිල්ලේ වේදිකාව සෑදීම 345000.00

සංශෝධිත යෝජනාව ඃ-

- ඇටඹගහවත්ත 393සී "දිවිතුරු" ප්‍රජාමණ්ඩලය සඳහා විදුලිජනක යන්ත්‍රයක් ලබාගැනීම 180000.00
- ඇටඹගහවත්ත 393සී "දිවිතුරු" ප්‍රජාමණ්ඩලය සඳහා සවුන්ඩ් බෆල් 2 ක් ලබාගැනීම 165000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 14. ගරු මන්ත්‍රී ධනුෂ්ක සාලින්ද මහතා යෝජනා කරයි ඃ-

2022 මන්ත්‍රී යෝජනා ඃ-

මුල් යෝජනාව ඃ-

- පල්ලෙගම ගුණරත්න මහතාගේ නිවස අසල මාර්ගය ඉදිරිපිට - 200000.00

සංශෝධිත යෝජනාව ඃ-

- පැපිලියවල පාසල අසල ක්‍රීඩාපිටිය දක්වා යන මාර්ගය සඳහා - 200000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එම්.රත්නසිරිලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 15. ගරු මන්ත්‍රී ධනුෂ්ක සාලින්ද මහතා යෝජනා කරයි ඃ-

2022 මන්ත්‍රී යෝජනා ඃ-

මුල් යෝජනාව ඃ-

❖ වඩුගෙදෙනිය පන්සල අසල මාර්ගය සඳහා - 300000.00

<u>සංශෝධිත යෝජනාව ඃ-</u>

❖ අනුරාගොඩ දකුණ ප්‍රජාශාලාව අසල මාර්ගය සඳහා - 300000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 15. ගරු මන්ත්‍රී ලෙස්ලි ගුණරත්න මහතා යෝජනා කරයි ඃ-**

**2022 මන්ත්‍රී යෝජනා ඃ-**

<u>මුල් යෝජනාව</u> ඃ-

❖ එගොඩ නාරම්පොල ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම - 100000.00

<u>සංශෝධිත යෝජනාව ඃ-</u>

❖ ගල්වලගොඩ කුරුකාවනාත වතුර මහතාගේ නිවස අසල මාර්ගය සඳහා - 100000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.ඒ.සී.ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**එ) කාරක සභා වාර්තා**

1. **2022.10.31 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු රැස්වීම් වාර්තාව**

<u>ගරු මන්ත්‍රී නිල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි,මෙහි අංක 03 ටයර් මිලදීගැනීම. මෙහි අපි මිලගණන් පිළිගත්තා.750 x13 සියැට් ටයර් එක කුවුන් සමාගමේ මිල රු.52750/- යි. ඒ කියන්නේ PR 16 කම්බි පොටවල් 16. අපි ප්‍රවාහනය ගැන කතාකර දිල්වින් ටයර් සෙන්ටර් එකෙන් ගන්න තීරණය කළා. එහි PR ඒ කියන්නේ කම්බි පොටවල් 14 තමයි රු.53505 එවිට මේ 16 යි 14 යි ලොකු වෙනසක් තිබෙනවා. ටිපර් එකටයි මෙය ගන්නේ එනිසා කම්බි පොටවල් 16 ටයර් වත් දැමියයුතුයි. බරට ඔරොත්තු දෙන්නේ ඒ ටයර්.

ඒ අනුව කම්බි පොට වැඩි එකෙන් ටයර් මිලදී ගැනීමට ගරු සභාව තීරණය කරන ලදී.

ඉහත සංශෝධනයට යටත්ව 2022.10.31 දින පැවති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මුදල් හාප්‍රතිපත්ති සැකසීමේ කමිටු රැස්වීම් වාර්තාවේ සඳහන් නිර්දේශ සභාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා විසින් ස්ථිර කරන ලදී.

2. 2022.11.08 දින පැවති පරසර හා පහසුකම් කමිටු රැස්වීම් වාර්තාව

ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, පරිසර කමිටු වාර්තාවේ නිර්දේශ සභාව පිළිගැනීම සුදුසු බව යෝජනා කරනවා. තරාලේ ඌරු කොටුවක් සම්බන්ධව මහජන විරෝධතාවයකට අනුව සෞ.වෛ.නි.කාර්යාලයෙන් නඩුවක් දමා තිබෙනවා.නඩුවක් පවරන විට සෞ.වෛ.නි.කාර්යාලයයි ප්‍රාදේශීය සභාවයි ස්ථානීය පරීක්ෂණයක්කර නඩු පවරන ලෙස ඉල්ලා සිටිනවා. ඌරෝ 100 ක් විතර ඉන්න තැන තිබියදී ඌරෝ 3 දෙනෙක් ඉන්න තැනට නඩුවක් පවරනවා. අපිට ස්ථානීය පරීක්ෂණයක් කරන්න කතා කරන්න සෞ.වෛ.නි.කාර්යාලයට කිසිම අයිතියක් නැති බව මහජන සෞ.පරීක්ෂක කිව්වා.

ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි, මේ ඌරු කොටු ප්‍රශ්නය අවුරුද්දක සිට ඇදෙන ප්‍රශ්නයක්. අපි මන්ත්‍රීවරු හැටියට එහි ක්ෂේත්‍ර පරීක්ෂණයට ගියේ නැහැ. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රධාන පෙළේ ඌරු කොටුවකට මේ වනවිට නඩුවක් දාලා විභාගවෙමින් පවතිනවා.

මේ සම්බන්ධව විධිමත් ක්‍රියා මාර්ගයක් ගන්න දිනයක් කියා ඒ දිනය පැන්නවිට නඩු දාන බව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා කියා තිබෙනවා. 03 සිටින ඒ ඌරු කොටුවේ විධිමත්භාවය නැති නිසා නඩු දාලා. එහෙම නඩු දාන්න අයිතියක් තිබෙනවාද කියා මෙතුමා එතුමගෙන් ඒ මොහොත් ඇසුවා .දවස් 14 න් මෙය කරන්න කියා දැනුම්දීමක්දකර තිබෙනවා.

ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රීතුමා බොරුවට සුදුහුනු ගාන්න එපා. අපිට ඔය නිලධාරීන්ගෙන් අපිට වැඩක් නැහැ. අපි පරිසර කමිටුවෙන් තීන්දු තීරණ ගන්නවානම් පරිසර කමිටුවෙන් ස්ථානීය පරීක්ෂණයක් කරනවිට අපිව කැඳවන්න කියලයි මම කිව්වේ. මගේ කොට්ඨාශයේ ස්ථානීය පරීක්ෂණයකට මාව කැඳවන්නේ නැතිවුවිට මම පරිසර කමිටුවේ සභාපති ලෙස සිටියදී ගමේ මිනිසුන්ගෙන් ඔය චෝදනා එනවා.ඌරෝ 3 කොටුවකට නඩු දාන්නත් ඌරෝ 100 කොටුවලට කිසිම හානියක් නැහැ. ඌරු කොටුවක් කිසිම කෙනෙකුට හානියක් නොවන් හදන්න බැහැ. මේ දෙගොල්ල නෑදෑයෝ. ඉඩම් ප්‍රශ්නයකට තරහා වු දා සිටයි මේ ප්‍රශ්නය. මෙහි රාජකාරි කරන්න එපා කියා මම කියන්නේ නැහැ. රාජකාරි කරන්නේ කොහෙද, ගංවතුර වෙලාවෙදී ඌරු කොටුව උතුරලා යනවා අර මන්ත්‍රීතුමිය ෆොටෝ පෙන්වුවා. වෙන්න ඕන දේ මොන පුද්ගලයාට හෝ හරියට තිබිය යුතුයි.

ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි, මම කියන්න ගියේ ගරු උපසභාපතිතුමනි,අපි මෙහි පරීක්ෂණයක් කරන්න ගියේ නැහැ. මෙතුමා පුන පුනා ඇහුවා ඔයාලගේ නිලධාරියෙකුට එහෙම නඩුදාන්න පුලුවන්ද කියා පරිපාලන ම.සෞ.පරීක්ෂන මහතාගෙන් ඇසුවා. පැවරී තිබෙන නීතිය ප්‍රකාරව සභාවෙන් නොඅසා නඩු දැමියහැකි බව කිව්වා.

මම කිව්වා මෙතුමටත් මෙය ලොකු කැලලක්. මෙයට අදාල නිලධාරීන් ,ගම්වාසීන් සහ ඌරු කොටු කරන අය කැඳවා පල්ලියේ සාකච්ජාවක් කරමු කියා. දැන් රටේ තිබෙන ආර්ථිකය අනුව අපිට ඌරු කොටු සම්පූර්ණ වහන්න බැහැ. අපිට මේ කරන ව්‍යාපාරය විධිමත් කළහැකියි.

ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි,මම කියන්නේ මෙහි නඩු දාන්න එපා කියන දේ නොවෙයි. ඒ පුද්ගලයාට මෙය විධිමත් කර ගැනීමට දවස් 14 ක් දෙනවා. අපිට ඒ දිනවල ස්ථානීය පරීක්ෂණයක් කරන්න ලියුමක් ගහන්න බැරී ඇයි,

පල්ලිය ගාව ගිහින් ඔබතුමා හිටගෙන ඉන්න. ඔක්කොම පල්ලියේ පූජාවට ඉන්නේ නහය වහගෙනයි. ඒත් රජකාරියක් නොකරන සෞ.වෛ.නි.කාර්යාලය ඌරෝ 3 කට අහිංසක මිනිහෙකුට නඩු දාන එකද හරී.නඩු දැමුවත් කමක් නැහැ. අපේ පරිසර කමිටුවක් තිබෙනවා. එහි යම් දේවල් පත්තරෙත් යනවා. වැඩිම ඌරු කොටු තිබෙන්නේ මගේ ගමෙයි. ඔවුන් සිතන්නේ මට ලොකු දෙයක් කළහැකි බව. ඌරෝ හදන මිනිස්සු හවසට බිවු පසු අම්මා තාත්තා මතක්කර බනිනවා.

ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)

ගරු මන්ත්‍රීවරුනි,පරිසරය සම්බන්ධව නඩු පැවරීමේ බලය සෞ.වෛ.නිලධාරීට තිබෙනවා. අපි කමිටුවක් විදිහට රැස්වෙන්නේ තීන්දු ගැනීමටයි. නඩු දාන එකට අපේ කමිටුව දැනුවත්වෙලා යන්න ගියොත් වෙන බලපෑම් එනවා. ස්ථානීය පරීක්ෂණයක් කරන එක හරි. නඩු දාන එක නිලධාරීන්ට ඇරලා අපි පැත්තකට වෙන එක වඩා හොඳයි නැතිනම් නඩු දැමුවයි කියා මන්ත්‍රීවරුන්ට අපවාද එනවා.

<u>ගරු මන්ත්‍රීනී නදිකා ප්‍රියංගනී මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මම ගිය සභාවෙදිත් ඔය තරාලේ තිබෙන මහා පරිමාණයේ ඌරු කොටු සම්බන්ධ අපිට අවස්ථාවක් දෙන්න කියා ලිඛිතව ඉදිරිපත් කළා. . නමුත් මේ වනතුරු අවස්ථාවක් ලැබුනේ නැහැ. ඒ අවස්ථාවේ මේ සඳහා ගියා නම් සමහරවිට මේ දේ වෙන්නේ නැහැ.

පරිසර කමිටුව ඌරු කොටු හිමියන් කැඳවා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

පරිසර කමිටු වාර්තාවේ නිර්දේශ සභාව පිළිගැනීම සුදුසු බවට ඉහත ගෙන ආ යෝජනාව ගරු මන්ත්‍රී චිත්‍රානන්ද ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ල) වෙනත් වාර්තා**

1. මාසික ආදායම් වාර්තාව - 2022 සැප්තැම්බර්
2. මාසික ආදායම් වියදම් වාර්තාව - 2022 සැප්තැම්බර්

ඉහත සඳහන් මාසික ආදායම් වාර්තාව හා මාසික වියදම් වාර්තා සභාව පිළිගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

3. මාර්ග නඩත්තු ඒකකයේ දෛනික නඩත්තු කටයුතු -2022 ඔක්තෝම්බර්
4. දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ඩෙංගු ඒකකයේ දෛනික කටයුතු පිළිබඳ වාර්තාව -2022 ඔක්තෝම්බර්

අංක 3 සහ 4 යටතේ ඉදිරිපත් කර ඇති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මාර්ග නඩත්තු ඒකකයේ හා ඩෙංගු ඒකකයේ දෛනික නඩත්තු කටයුතු පිළිබඳ සකස් කරන ලද වාර්තා මෙදින සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

5. ඇස්තමේන්තු අනුමැතිය සඳහා

| ව්‍යාපෘතියේ නම | මුදල |
|---|---|
| 1. කුරුසපිටිය පළමු පටුමග සංවර්ධනය කිරීම | රු.670000.00 |
| 2. පුගොඩ විශාඛා මාවතේ 4 වන පටුමග අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | රු.320000.00 |
| 3. ගම්පලගෙදර ප්‍රජාශාලාව අළුත්වැඩියාව | රු500000.00 |
| 4. බංගලාවත්ත කණිෂ්ඨ විද්‍යාලය ඉදිරිපිට ජයන්ත මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම | රු.150000.00 |
| 5. මීතිරිගල සිර කඳවුර පාර සකස් කිරීම (11අදියර) | රු.700000.00 |

ඉහත අංක 5 යටතේ ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සභාව පිළිගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී එස්.එම්.රත්නසිරිලාල් මහතා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රීනී අජන්තා රෝහිනී මිය මහතා විසින් ස්ථිර කරන ලදී.

**5. 2023 වර්ෂයට අදාලව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම**

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, නොවැම්බර් 29 වන අගහරුවාදා දින 2023 අයවැය සභා රැස්වීම පැවැත්වෙනවා. ඊට පෙර අයවැය සාරාංශය ඉදිරිපත් කර සාකච්ඡා කිරීමට මහා සභාව කාරක සභාවක් හැටියට පත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාව බවට පත්විය යුතු යැයි ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභාව විසින් අයවය කෙටුම්පත සාකච්ජා කළ අතර ඒ පිළිබඳ විවාදය නොවැම්බර් 29 පැවැත්වීමට යෝජනා විය.

කාරක සභා අවස්ථාව නැවත මහා සභාව අවස්ථාවට පත්වීම සුදුසු යැයි ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

(ඌ) වෙනත් කරුණු

<u>ගරු මන්ත්‍රී ආර්.පී.එම්.ඩී.අමින්ද රෝහිත මහතා (ශ්‍රී.නි.ප.)</u>

ගරු සභාපතිතුමනි, රදාවානේ අළුතින් හදපු උද්‍යානය වටේ දමු ලයිට් වලින් පද්ධතියේ වයරින් එකේ දෝෂයක් නිසා මේන් ලයින් එකට නිවුටල් එකෙන් කරන්ට් එක යනවාලු. එය අහුවෙලා තිබෙන්නේ ඊට කිලෝ මීටර් භාගයක් විතර එහා ගෙදරකින්. එහි නිවුටල් එකේ කරන්ට් එක තිබෙනවාද කියා බැලූ අවස්ථාවක හංදියේ ලයිට් නිවලා තිබෙන විට නැතිලු. ලයිට් දැමු විට නිවුටල් එකේ කරන්ට් එක එනවාලු. ඒ අය මණ්ඩලයට පැමිණිලිකර හංදියේ ලයින් එක ඩිස්කනෙක් කර තිබෙනවා. එය මෙහාට දැනුම්දුන් බව මණ්ලඩයෙන් කියනවලු. ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, වර්ෂාවත් එක්ක අපේ ප්‍රදේශයේ වීදිපහන් පිච්චිලා යනවා. කඨින පිංකම් නිසා වැඩිපුර පහන් යෙදුවා. අපේ විදුලි නඩත්තු කණ්ඩායම් සේරම එකට ඒකරාශිකරලා එක දවසකට කොට්ඨාශය බැගින් අරගෙන එකවර සේරම විදුලි පහන් ටික අළුත්වැඩියා කිරීමට යොදන්න පුලුවන්නම් හොඳයි. එක කණ්ඩායමකට විතරක් මෙය කරන්න අමාරුයි. මගේ කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 7 ක් තිබෙනවා. එනිසා මම මේ යෝජනාව කරනවා.දවස් 25 ක් ගියොත් කොට්ඨාශ 25 මේ වැඩය කර ඉවර කළහැකියි. වැස්සෙන් බාදා නොවුනොත්.

ඉලුක් ප්‍රශ්නය සභාවටත් පරිසර කමිටුවටත් නිතර එන ප්‍රශ්නයක්. එයටත් මම මේ යොජනා කරනවා. උදාහරනයක් විදිහට රණවිරුගම සිට කැරගල දක්වා මාර්ගය ඉලුක් වැවී තිබෙන්නේ හරිම අනතුරුදයක වන විදිහට. අයවැයත් එනවා. දොම්පෙ ආසනයේ යන්න බැරිම පාරවල් තිබෙනවා. ඒවාට නොයෙක් ව්‍යාපෘති එයි කියා බලන් සිටියාට ආවේ නැහැ. මේ පාරවල් පිළිබඳ යෝජනාවල් අරගෙන කමිටුවකට යොමුකර අපක්ෂපාතී තීරණයක් අරගෙන අයවැයට කලින් ඒවා ඇතුලත් කරන්න පුලුවන් නම් හොඳයි. අනිකුත් තිබෙන ව්‍යාපෘතිත් ප්‍රමුඛතා ලැයිස්තුවක් අරගෙන ඒ පිළිවෙල අනුව සකස් කරන්න පුලුවන්නම් හොඳයි.

ගිය 17 වෙනිදා කම්කරුවෝ 08 දෙනෙක් දාලා ක්‍රීඩාපිටියේ තණකොළ ගැලවුවා කියා මේ වාර්තාවේ තිබෙනවා. දැන් පාසල්වල ක්‍රිකට් තරඟ පැවැත්වෙන කාලය. අපි මේ පිට්ටනි නිසි පරිදි නඩත්තු කරනවානම් තරඟ වලට ළමයි හරහා පණිවිඩය ගිහින් ප්‍රසිද්ධවෙනවා. සමහර පාසල්වලට නොමිලේ ලබාදෙනවා. ඒවගේ සහනයක් දෙනකොට අමතර ආදායමක් ලෙස මේවා නිසි පරිදි නඩත්තු කළොත් වැඩිපුර උපයාගන්න පුලුවන්. ඒවාගේම විනිසුරුවන් ආවහම ඉන්න තැනක් නැහැ. ලකුණු සටහන් කරන අයට වාඩිවෙන්න පුටුවුක් නැහැ. කබල් පුටු වගයක් දීලා තිබෙන්නේ. ඒ අවම සුදුසුකම් ටිකවත් නැහැ. අඩුම ගානේ ඒ ටිකවත් සලසා දෙන්න පුලුවන්නම් මීට වඩා කණ්ඩායමක් මෙතනට ගෙන්වා ගන්න පුලුවන්..ඒවගේම මාළිගාවත්ත ක්‍රීඩ්පිටියේ පොදු වැසිකිලයත් අබලන් වෙලා. අපිරිසිදුයි. මේවා ගැන සොයා නොබලන්නේ ඇයි, නිසි පරිදි ක්‍රියාත්මක නොවුවිට පයින් ගහලත් යනවා. ඒ ගැන අවධානය යොමු කරන්න.

ඔබතුමත් අහන්න ඇති පාසලක ගුරුවරයෙකුගේ පර්ස් එකක් සොරකම් කරපු දරුවෝ ගැන ප්‍රවෘත්තියක් මේ දවස්වල කතා වෙනවා. මේවා මාධ්‍යවල ප්‍රචාරය වෙන එකත් පාපයක්. ගුරුවරයෙකුට ළමයෙකුට වරදකට දඩුවම් දෙන්න බැරි එකේ පාපය විඳවන්න වෙන්නේ අපිට නොවෙයි අපේ දරුවන්ටමයි. දරුවෝ හදන්න දඩුවම් දුන් විදුහල්පති අද රිමාන්ඩ් මේ රට දැන් කොතනටද යන්නේ . මේනිසා තමයි සොරකම් මත්ද්‍රව්‍ය කුඩු ගම්වල වැඩිවී තිබෙන්නේ. මේ සභාවේ ගුරුවරයෙක් ගෙන් වේවැල් පාරක් නොකාපු කෙනෙක් නැතිව ඇති. අපිට වෛරයෙන් ක්‍රෝධයෙන් දඩුවම් දුන් ගුරුවරු ඉන්නවද,
අදටත් අපි ගුරුවරුන්ට ගෞරව කරනවා. විනයක් නැතිව හැදෙන ළමා පරපුරින් තමයි ඉදිරියේදී අපරාධකරුවන් බිහිවන්නේත් දහම් පාසල්වලට තියෙන අවධානය අඩුකමත් මීට හේතුවක්.

දන් කුඩු නිසා තමයි සොරකම් කරන්නේ මණ්ඩාවල ගමේ බිස්නස් කරන්නේ පොඩි ලොරි දෙකකින් තමයි. ලොරිවල තට්ටු ගලවගෙන ගිහින්. මේ මිනිසුන්ට බෙල්ලේ වැල දාගන්න තත්වයක් දන උදාවී තිබෙනවා. පන්සල ඉස්සරහ ගෙදර හොරු කඩලා. පෙරේදා රෑ මණ්ඩාවල ඉස්කෝලේ ඉස්සරහ මනුස්සයෙක් හප්පාගෙන ගිහින්. ඒ ගොඩක් අමාරුවෙලු. නතර කරලා බැලියයුතුයි කියන හැඟීම අද මිනිසුන්ගේ හිත්වල නැහැ. පොඩි ළමයින්ව 5,6 දෙනා එකතුවෙලා දූෂණය කරනවා. අද ඒ මිනිසුන්ට දඩුවම් කරනවද, දවස ගානේ කොළඹ රැස්වීම් තියනවා. මේවාට වියදම් කරන්න සල්ලි කොහෙන්ද, හාමුදුරුවොත් ගිහින් ඉන්නවා. ඉංජිනේරු පීඨයේ සිසුවෙකුත් අයිස් මත්ද්‍රව්‍ය භාවිතාකර අසුවුනා. ඉතින් රටක් තියෙයිද, ප්‍රකෝටි ගණන් ණයගන්නත් මේ විදිහට මේ රට ගොඩගන්න ලැබෙන්නේ නැහැ. ස්තුතියි.

<u>ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, අද කිරිඳිවැල බස් නැවතුම්පලේ මේ වනවිට බස් වැඩ වර්ජනයක් ක්‍රියත්මකවෙනවා. මෙයින් පාසල් ළමුන් බොහෝ ප්‍රමාණයක් අපහසුතාවට පත්ව තිබෙනවා. දැනුත් මම ගම්පහ ඒ සිද්ධිය සිදුවූ තැනට ගිහින් ආවා. බස් වැඩ වර්ජනයක් කරන්නේ දඩ කොළ ලබාදීම සම්බන්ධව තමයි. රූපවාහිනී නාලිකාවලත් ඒ ගැන කතා කළා.
මම බස් රථ හිමියන්ගේ පැත්ත ගන්නේ නැහැ. දඩ කොළ දී තිබෙන්නේ අපි අතින් සිද්ධවුනු වැරැද්දක් නිසයි. ඒ නීතිය පොලිසිය ක්‍රියාත්මක කරන ආකාරයෙයි යම් වරදක් තිබෙන්නේ. ඕක තමයි මේ ප්‍රශ්නයට මුල.

මගේ හිතවත් මන්ත්‍රීතුමා වතුරුගම කොට්ඨාශයේ ඉඩමක් වෙන්දේසියක් ගැන  ගැන නිතර කතා කළා. එතුමාගේ ඉඩම හරහා කාණුවක් බැඳපු නිසා තමයි තමයි ප්‍රශ්නය හැදුනේ. ඒ ස්ථානයේ මේ වනවිට ගල් සම්පූරණයෙන් ගැලවිලා ගිහින්. මම දැන් ඒ ස්ථානයට ගිහින් ආවේ. ඒ ඉඩමෙන් ගලාගෙන එන වතුර නිසා අවට ජනතාවගේ ඉඩම් විනාශ වෙලා ගිහින්. කුඹුර යායේ පස්,වැලි ගොඩ ගැසිලා තිබෙනවා. සභාපතිතුමා කමිටුවක් පත්කරගෙන හෝ ඇවිත් බලන්න. මාත් එන්නම්. මේ ඉඩම නිසා පරිසරයට වෙලා තිබෙන  හානිය කොපමණද . ජනතාවට තිබෙන එකම පිළිසරණ ප්‍රාදේශීය සභාවයි. මේ ගැන ගරු සභාපතිතුමනි අවධානය යොමු කරන්න. මේ ඉඩම වෙන්දේසි කරන්න කලින් ගමේ මේවගේ ප්‍රශ්න කවදාවත් ඇති වුනේ නැහැ. වෙන්දේසි කරන්නේ අක්කර 8,9 ක ඉඩමක්. ඉඩම්  වෙන්දේසි කලාට කමක් නැහැ. පරිසරයට වන හානිය නතර  වියයුතුයි. ඉඩම් ටික කුඹුරුවලට හේදිලා යනවා. මේ වෙන්දේසිය කරන්නේ මයිලෑන්ඩ් එකෙන්. මිනිස්සු බනිනවා සභාපතිතුමා අනුමැතිය දීලා නිසයි මෙහෙම කරන්නේ කියා.

<u>ගරු සභාපතිතුමා ( ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතුමනි, අනුමැතිය දී නැහැ.

<u>ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි,අනුමැතිය නොදුන්නට ඉඩම් කට්ටි මිලදීගත් අය ඉන්නවා. ඔයාලගේ පැත්තනේ මම ඉඩමක් ගත්තා රෙස්ටුරන්ට් එකක් දාගන්න පුලුවන් නේද කියලා ගම්පහ ඉන්න කෙනෙකුත් මගෙන් ඇසුවා. අනුමැතිය ගන්නේ නැතිව බලහත්කාරයෙන් ඉඩම් වෙන්දේසි කරන්න පුලුවන්ද, පුලුවන්නම් රටේ නීතියක් නැතිව යනවා. මම යන පන්සලේ ඉඩමේ එක කොටසක පැත්තෙන් මේ ඉඩම පිහිටා තිබෙනවා. මට ගමේ ඉන්න බැරි තත්වයක් ඇති වෙයි. මේනිසා පරිසර කමිටුවෙයි කාර්මික සේවා කමිටුවෙහි සභාපතිවරු හා නිලධාරීන් එතනට ගිහින් පරීක්ෂාකර බලා මෙය නතර කරන්න .මම ලෑස්තියි මගේ වාහනේ ප්‍රවාහන පහසුකම් ලබාදෙන්න. හරි පුද්ගලයෙක් තමයි කරුණු විමසන්න ඕනෑ ගිහින්. ඉඩම් වෙන්දේසි කරන අයගේ ඥාතීන් මේකට කැමතියි. අපි කතා කරන්න ඕනෑ පරිසර හානිය වෙච්ච අය සමඟයි. මගේ ගමේ මේ කටයුත්ත කරලා දෙන්න අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.නි.ප.)</u>

ගරු සභාපතිතුමනි,ඕවිටිගම වතුර ප්‍රශ්නයක් ගැන ඔබතුමාට අද උදේ ඉල්ලීම්කර ලිපියක් ලැබෙන්න ඇති. මටත් ,ලාල් මන්ත්‍රීතුමාටත්,උපසභාපතිතුමාටත් පිටපත් තිබෙනවා. මේ ගෙදර පුදුම වන්ඩි පාට් එකක් තිබෙන ගෙදරක්.මේ  පාර පාවිච්චි කරන්නේ ඒ පාර අයිති ගෙවල් පහ හය විතරක් නොවෙයි, පෙරපාසලේ 100 ට අධික ළමුන් සහ දෙමාපියන් . ඕවිටිගම කණිෂ්ඨ විද්‍යාලයේ පිටුපස පිවිසුම තිබෙන්නේ ඔය පැත්තට.

ප්‍රධාන පාරට අවහිරවෙන නිසා ගොඩක් වෙලාවට වාහන ටික ඇවිත් ළමයි ගන්නේ ඔතනින්. කුඩා දරුවන් ඔතනින් එන විට සපත්තු දෙක ගලවාගෙන අතේ ගෙනයන්න වෙන තත්වයක් තිබෙනවා. මම ඔතන ප්‍රධාන පාර කොන්ක්‍රීට් කරනවිට මට කරන්න දුන්නේ නැහැ.

(මෙම මාර්ගය පරීක්ෂාකර බලා විසඳුමක් ගන්නා බව ගරු සභාපතිතුමා පවසන ලදී.)

ඔබතුමා මෙයට දැන්මම මැදිහත්වීම ගැන ස්තුතිවන්තවෙනා. ඒවගේම ගරු සභාපතිතුමා වෙනදට බොහොම ජවයෙන් කතාකරන සාලින්ද මන්ත්‍රීතුමාගේ මම අද දැක්කේ අදෝනාවක්. අපි අවුරුදු 5 ක සිට ඉඩම් වෙන්දේසිය ගැන මේ ප්‍රාදේශීය සභාවේ කතා කරනවා. ඒ කතා කරපු දේවල්වලට අපිට උත්තරයක් ලැබී නැහැ. එහෙනම් අපි පේල් නැද්ද.

(ගරු සභාපතිතුමා සභාවෙන් මදකට නික්ම ගිය බැවින් මූලාසනය ගරු උපසභාපතිතුමා විසින් හොඹවන ලදී)

අපි අවුරුදු 5 සිටන් මේ ඉඩම් ප්‍රශ්නය ගැන කතා කළා. අපි තවමත් ඉඩමක් වෙන්දේසිකරන විට එකම ප්‍රශ්නය කතා කරනවා. අපේ විපක්ෂනායකතුමා හැමදාම කියනවා දොම්පෙ ප්‍රාදේශීය සභාවේ සභාපතිට ඉහලින් කාක්කෙකුටවත් පියාඹන්න බැරි බව. අද ඔක්කොම ටික පියාඹනවා. ඉඩම් වෙන්දේසිකාරයො,කළුකඩ කාරයෝ,පෙටිකඩ කාරයෝ, පස්කපන අය පියාඹනවා. ඕනෑම ප්‍රාදේශීය සභාවක සභාපති කියන්නේ ප්‍රධාන පුරවැසියා. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත. විධායක බලතල තිබෙනවා. විධායක බලතල තිබෙන ජනාධිපති කෙනෙක් ඉන්න රටක විධායක බලතල තිබෙන ප්‍රාදේශීය සභාවේ සභාපති හදලා තිබෙනවා. අපි මන්ත්‍රීවරු 43 ක් ඉන්නවා. අපි දො.ප්‍රා.ස. හැටියට ආදර්ශයක් දී තිබෙනවා සභාපතිතුමා හැටියට සභාවක් හැටියට ගන්න තීන්දු තීරණ වලට අපි ඒකමතිකව ඉතිහාසය පුරාවටම හැමෝගෙම සහයෝගය ලැබී තිබෙන ප්‍රාදේශීය සභාවක් මෙය. අයවැයට විරුද්ධ වුනේ ජ.වි.පෙ. විතරයි. එය ඒ අයගේ ප්‍රතිපත්තියක් වියහැකියි. එහෙව් ප්‍රාදේශීය සභාවක් තියාගෙන අද සාලින්ද මන්ත්‍රීතුමාගේ කතාව මම දැක්කේ අදෝනාවක් හැටියටයි. මේ රටේ කුඩු ප්‍රශ්නය තිබෙනවා. අද ගෙදරක බඩුවක් තියාගන්න විදිහක් නැහැ. මෙය නතර කරන්න කිසිම කෙනෙකුට උත්සාහයක් නැහැ. හැමෝම බලන්නේ තමන්ගේ බලය රැකගෙන තමන් හරියි කියන තැනක ඉඳන් කතා කිරීම පමණයි. එය මනාවට නැවත වරක් ඔප්පුකර පෙන්වුවා. මෙහි ආණ්ඩු මාරුකළාට පුද්ගලයා මාරු කළාට මේ ප්‍රශ්නය නොවිසඳෙන බව එදත් අපි කිවුවා. අද වෙලා තිබෙන්නෙත් ඒකයි. අපි තවත් අත්පොලසන් දිදී ඉන්නවා මිසක් හරි විකල්පයක් මෙයට හදන්නේ නැහැ.

අපි තාම මජර දේශපාලනයට බැඳී සිටිනවා. දො.ප්‍රා.ස.වේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 25 දෙනාට වගකීමක් තිබෙනවා ඔබතුමන්ලගේ ආණ්ඩුව , සභාපතිතුමා ,උපසභාපතිතුමා,ආසන සංවිධායකවරයා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හරි පාරේ යන්නේ නැතිනම් රනිල් වික්‍රමසිංහ මහතාට පක්ෂව අත උස්සන්න එපා කියා කියන්න. අද මෙතනට ඇවිත් රනිල් වික්‍රමසිංහ මහතාට රට කන්නම වාසනාව ලැබේවා කියා කියනවා. අපේ දරුවෝ තාම පොඩියි. ඉන්න හිටින්න තැනක් පේන තෙක්මානෙක නැති රටක් මේක. මෙයට අපි හැමෝම වගකිවයුතුයි. 77 පසු සියළුම නායකයෝ මෙහි වගකීම භාරගතයුතුයි. එහි එක පක්ෂයකටවත් ගැලවෙන්න බැහැ. මේ හැමෝම 77 පසුව මේ ආණ්ඩු ඇතුලේ හිටියා.

(ගරු සභාපතිතුමා නැවත ගරු සභාවට පැමිණි සභාවේ මූලාසනය ගරු උපසභාපතිතුමා විසින් හොඹවන ලදී)

අපි කඩිනවලට,පාරවල් ශුද්ධ කළා. ලයිට් ටික හැදුවා. අපිට අද ලියුම් පිට ලියුම් දුන්නත් පාරක් ශුද්ධ කරගන්න බැහැ. අද ලේකම් මහතා කම්කරුවා වෙලා කම්කරුවා මහත්තයා වෙලා.ඒ අයට කතා කරන්න බැහැ. ලොකු බලයක් ඔවුන්ට තිබෙනවා. මම ඊයේ දැක්කා බාටා. මට හරි දුක හිතුනා. සභාවේ ටී ෂර්ට් එක ඇඳගෙන පාර පුරා එනවා. ඊට පසු සකරාජ ඩොක්ටගේ වැට ළඟ පාර අයිනේ නිදි. අපි මෙතන කොපමණ කතා කළත් වැඩක් නැහැ. මෙතන එය ක්‍රියාවට නැන්වෙන්නේ නැහැ. ඔබතුමා මෙහි වාඩිවූ විට ලොකු වෙනසක් වෙයි කියා මට ලොකු විශ්වාසයක් තිබුණා.. ඔබතුමාට යමක් කිවුවොත් කරනවා.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. අපේ පාරවල් ටික ශුද්ධ කරගන්න බැරිනම් ඇති වැඩේ මොකක්ද,අපි ඉදිරි වර්ෂයට අයවැය හදනවිට අපේ ප්‍රා.ස.වෙන් ඉටුවිවයුතු සේවාවන්ට වැඩි අවධානයක් යොමුකළයුතුයි. පාරවල්වල දෙපස ගස් ටික ශුද්ධ කරන්න සාලින්ද මන්ත්‍රීතුමා දීර්ඝ වශයෙන් කතා කළා. එයට වැඩි අවධානයක් යොමු කළයුතුයි. අද හැම උපකාර්යාලයටම ට්‍රැක්ටරයක් ,කම්පැක්ටරයක් තිබෙනවා. අපි සම්පත් අතින් දියුණු වෙලා තිබෙනවා. අපි මේ සභාවේ නගන හඬ ඔබතුමන්ලාට දක්ෂ මන්ත්‍රීවරයෙන් ඉන්නවා රූපවාහිනී විවාදවලට යන. ඒ අය ඉදිරියේ හඬ අවදිකර මෙයයි වියයුතු බව කියන්න. කණ්ඩායම් සාකච්ඡාවෙදී එතුමා කියන දේ හරි කියා මෙතන ඇවිත් කොපමණ ආණ්ඩුවට විරුද්ධව කෑ ගැසුවත් ඇති වැඩක් නැහැ කියන එකයි මගේ අදහස . බොහොම ස්තුතියි.

<u>ගරු මන්ත්‍රී චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, හැමදාම වගේ වීදිපහන් ප්‍රශනේ ගැන තමයි කියන්න වෙන්නේ. සාලින්ද මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් කළා. ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුලුවන්නම් හොඳයි.එවිට අපිට එල්ලිලා වැටෙන වීදිපහන් ටික එහෙම නියමිත ආකාරයට හදාගන්න පුලුවන්. නැතිනම් එක පැත්තකින් වීදිපහන් හදනකොට අනිත් පැත්කෙන් නැටිටෙන් එල්ලිලා තියෙන්නේ පහන් ටික. පසුගිය මාසෙම වැස්සත් එක්ක වීදිපහන් හදාගන්න බැරි වුනා. එක දිනයක් තිබිලා මම වීදිපහන් හදාගන්න ආවා. මම චෝදනා කරන්න අකමැති දෙයක්. උදේ 10 ට විතර ආවා. දවල් 12 ට විතර හදලා ඉවරයි කියා මට කෝල් එකක් දුන්නා. පැය 2 න් හදලා ඉවරද කියාමම ඇසුවා. බල්බ් 20යි ගෙනාවේ ඒක ඉවරයි කියා කිවුවා.

මම දොම්පෙ කාර්යභාර නිලධාරිතුමියට කතාකර ඇසුවා බල්බ් 20 ක් දුන්නේ ඔබතුයිද කියලා. නැ මන්ත්‍රීතුමා ඒගොල්ලෝ තමයි බල්බ් අරන් යන්නේ කියා කිවුවා. ගිය මාසයේ මගේ එක බල්බ් එකක්වත් හැදුවේ නැහැ. තව දවසේ වෙලාවත් ඉතුරුයිනේ කිවුවහම එන්න කියා තව බල්බ් 10 ක් දුන්නා. මේ සේවකයින්ගේ හදවතේ ඒ සේවය නැහැ.අපේ කොට්ඨාශවල විදිපහන් නිසි පරිදි පත්තු වෙනවානම් අපිට කාටවත් චෝදනා කරන්න දෙයක් නැහැ. එහෙන් මෙහෙන් බල්බ් ටික සවිකරලා යන්න බලනවා.

අනික මම වීදිපහන් ගන්න තිබෙන කනුවලට අංකයක් දෙමු කිවුවා. එවිට අංකය අනුව අදාල නිවසේ පුද්ගලයාට ඇමතුමක් දෙන්න පුලුවන්. ලේකම්තුමා එක්ක කතා කළහම එහෙම ක්‍රමයක් හදාගෙන යනවා කිවුවා. ඒ කණුවේ උපකාර්යාලයේ අංකයත් දැමුමාවනම් හරි. නැතිනම් සමනබැද්ද, කිඹුල්විලවත්ත පැත්තේ අය උපකාර්යාලයට ඇවිත් පැමිණිලා කරනවා අඩුයි. මෙයට ක්‍රමවේදයක් හැදුවේ නැතිනම් වෙන කෙනෙක් සභාපති වුනත් මන්ත්‍රී වුනත්ප්‍රශ්නේ එනවා.

පාරවල්වල කැළෑ ශුද්ධ කරන එක ගැන කතා කළා. රැකියා ලක්ෂේ අයගෙන් 80 ක් විතර සභාවට ආවා. දන් අපේ පාරවල්වල කැලය ඒ අය හරහා ශුද්ධ කරගන්න පුලුවන් කියා අපි බලාගෙන සිටියා. ගම් සභා කාලේ නම් මේ දේ හරියට සිදුවුනා. අද මෙච්චර සේවක පිරිසක් ඉන්නැද්දිත් කැළෑ ටික එළි කරගන්න බැරි වුනා. මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල් ගණනාවක වලවල් හැරිලා තිබෙනවා. දෙකටන හංදියේ ඉඳන් කළුකොඳයාව හංදියට ගත්තත් විශාල වළවල් ප්‍රමාණයක් තිබෙනවා. කටුලන්ද හංදියේ විශාල වලක් හැරී තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියට අපි කතා කළා. ලියුම් ලිවුවා. නමුත් ඒ ආයතනයට වඩා ඉස්සරහින් ඉන්නවා ප්‍රාදේශීය සභාව. අපි මොන විදිහකින් හරි කිවුවොත් ප්‍රීමික්ස් එකෙන් ඇවිත් වලවල් ටික වහලා යනවා. නමුත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් එහෙම කරන්නේ නැහැ. සමහර වාහන වැටුනොත් ගොඩගන්න බැරි ඒවා තිබෙනවා. දෙකටන විලේජ් එක ගාව. ඒ ගැන ඔබතුමා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන්න.මිනිස්සු දන්නේ නැහැ මේ මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල් බව. අපිටයි කියන්නේ මගේ හීල්බත්ගල පාරෙන් ගොඩ වෙනතැනම ගහක් තිබුණා ප්‍රධාන පාරේ ඇළ අයිනේ. ඒ ගහ ගලවගෙන ඇලට වැටුනා. මුලත් එක්ක පාරේ තිබුණු වපසරියත් එක්ක තමයි ගහ ඇළට වැටුනේ. දන් පාරේ වශාල වලක් හැරිලා. මෙය පිළිසකර කරන්න කියා ඉල්ලා සිටිනවා. වාහන ගන්නත් බැහැ .එතන වහලා තිබෙන්නේ . පවුල් 400 ක් විතර ජීවත්වෙන ගමක් තිබෙන්නේ මෝරගල. ඒකට ඇතුල්වෙන්න බැරි මට්ටමක් තිබෙන්නේ. මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, අපිට තහංචි දාලා තිබ්යදිත් ඔබතුමා ඇතුලු ප්‍රජා සංවරධන කමිටුවේ සභාපතිතුමා සාහිත්‍ය උත්සවය කරලා හොඳ සාහිත්‍ය දේශනයක් දීලා ඒ දේශනය අතුරතුරේ සියනෑ ගෞරව සම්මානයෙන් පිදුම් ලැබූ නවගමුවේ රේවත හාමුදුරුවන්ගේ හැකියාව ප්‍රාදේශීය සභාවක් හැටියට ගන්නවා මදියි කියන එක පිළිබඳව ඒත්තු ගන්වා ඒ සම්බන්ධ වටිනාකමක් ලබාදුන් ඔබතුමා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපතිතුමා ඇතුලු ලේකම්තුමා සියළුදෙනාට ස්තුතිය පුදකනවා. නවගමුවේ රේවත හාමුදරුවන් එක්ක තිබෙන සම්බන්ධතාවය ටේප් කරලා කරගන්න කියු එක ගැන අවධානය යොමුකරනවා.

කිරිදිවැල නගරයේ තුන්මංහන්දියේ කාණු වලින් දුගඳ හමනවා. ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න කියා ඉල්ලනවා.

කිරිදිවැල එක්සත් ව්‍යාපාරික සංගමය ශක්තිමත්ව ක්‍රියාත්මක වුනා. අපි එකතු කරපු ලොකු මුදලකින් CCTV කැමරා ගෙනත් දුන්නා. ඒ කැමරා ටික දැන් අක්‍රියයි. සභාවක් හැටියට ඒවා නඩත්තුකර පවත්වගෙන යන්න ක්‍රමවේදයක් සකස් කරන්න.එය අවශ්‍යම කටයුත්තක්. අනතුරක් සිදුවුනත් යම්කිසි දෙයක් සිදුවුනත් අපිට බලන්න පුලුවන්. ඒ ගැන අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

කිරිදිවැල මහා විද්‍යාලය අවට කාණු ටික ශුද්ධකරගයුතුයි. ඉස්සරහට තව වැඩකටයුතු වාගයකුත් සිදුවෙනවා. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රිනී නදීකා ප්‍රියංගනී මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, දොම්පෙ වැලිවත්ත ග්‍රාමයෙහි හද්දාගල කන්ද ගම් ප්‍රදේශයට යන මාර්ගය අබලන්වී තිබෙනවා. මීට කලනුත් මෙහි පිටපතක් දී තිබෙනවා. හද්දාගල කන්ද දකින්නේ සුන්දරම ගලක් වශයෙන්. 2023 අයවැයෙන් හෝ යම්කිසි මුදලක් වෙන්කර මෙය සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.
වැලිවත්ත පාර ගැන හැමදාම කතා කරනවා. අපිට ගමට යන්න බැහැ චෝදනා. මේ පාර පසුගිය ආණ්ඩුවෙන් ඇවිත් කපා දාලා ගියා. අද වෙනකම් කිසිම සංවර්ධන කටයුත්තක් සිදුවෙන්නේ නැහැ.වැලිවත්ත ප්‍රධාන මාර්ගය බයිසිකලයෙන්වත් යන්න බැරි තත්වයට පත්ව තිබෙනවා. අපි සභාවෙන් හැකි විදිහට ප්‍රිමික්ස් අතුරලා වලවල් ටිකවත් වහලා දුන්නානම් අඩු තරමේ මෝටර් සයිකලයත්වත් යාහැකියි. ඒ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන්න කියා ඉල්ලමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී මලින්ද ගුණරත්න මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ කුඩු පාවිච්චි කරන අය වැඩිවෙලා තිබෙනවා. මම එන්න පෙර සාලින්ද මන්ත්‍රීතුමත් මේ ගැන කතා කරන්න ඇති. දැන් වතුර මෝටර් නැහැ. සමහර ගෙවල්වල බොලොක්ක දාලා ළිඳෙන් ඇදලා වතුර ගන්න වෙලා. පුවක් ටිකක් විකුණගන්න නැහැ. මල් පෝච්චියක් තියාගන්න නැහැ. ලොකුම ව්‍යසනයකට පත්ව තිබෙනවා පල්ලෙගම,පැපිලියවල,ගණිහිගම පැති. පසුගියදා අපේ පන්සලේ කඨින පෙරහැර තිබුනා.
අපේ ගමේ ගෙදරකට හොරු තුන්දෙනෙක් ඇතුල්වෙලා බඩු ගණනාවන් ගත්තා. එහිදී  පෙරහැර පටන්ගන්න පෙර ගෙට පනින්න තුන් දෙනක් ඇවිත් කෑම කාලා ආවා මාත් එක්කත් ඒ ගෙදර මල්ලි එක්කත් කතා කළා.
පෙරහැර එනවුස් කරන බුද්ධික මල්ලි එක්කත් කතා කළා. අපි පන්සලට යනවිට පන්සලේ රංවල දානෙත් අර හොරු තිදෙනා ඉඳගෙන කෑම කනවා. එවිට රෑ 8 යි වෙලාව. අර මල්ලි මට ගෙදරට ගිහින් කෝල් කළා සිවිලිම කඩලා ගෙට හොරු පැනලා කියා. එවිට අපි පොලිසියටත් කතාකර CCTV කැමරා චෙක්කරනවිට පල්ලෙගම ඒ ප්‍රසිද්ධ සොරකම්කරන කොල්ලා රාජා මහත්තයලෑ වත්තෙන් ඇවිත් එළියට බහිනවා පෙනුනා.  පොලිසියට කිවුවත් මේ සොරකම ගැන මොකවත් කළේ නැහැ.අපි මේ ගැන සොයනවිට ඒ ගෙනිහින් විකුණලා කුඩු ගත්තැන තව කුඩු ගේන්න කෙනෙක් ගිහින් හිටියා ඒ අයගෙන් මුලු ඔක්කොම වාර්තාවක් ලැබුණා. අපිට මෙය  කියන්න පොලිසියට විශ්වාසයක් නැහැ. පොලිසිය ඉන්නේ කුඩුකාරයෝ කසිප්පු කාරයොත් එක්ක නිසා. ඊට පසු අපි බුද්ධි අංශයේ අයි.පී. මහතෙක් සම්බන්ධ කරගෙන  තුන්දෙනාම පාන්දර 4 දෙනාම අරගෙන පොලිසියට ගෙනාවා. ඊයේ උසාවියටත් දැමුවා. එය පත්තරෙත් ගියා.  ඔය හොරකම් සීයකින් විතර අල්ලපු එක. පොලිසිය එන්නෑ අල්ලන්න.දැන් දොම්පෙ ආසනයේ සම්බන්ධීකරණ කමිටුවකුත් නැහැ. ඔබතුමා හරි මෙහි ප්‍රධානියා  හැටියට මේ කටයුත්තට මුලිකත්වය දීලා ආසන සංවිධායකතුමාට හෝ කියා මේ ගැන සාකච්ජා කරලා මේ ගැන මොනවා හෝ දෙයක් කරන්න.

මාර්ග ඉදිකිරීම ගැන කතා කළා ගරු මන්ත්‍රීවරු. පැපිලියවල ඇල පාර ගත්තොත් සියඹලගහවත්ත හරහා ගණිහිගම දකුණ පාරේ දිගටම කැලය තිබුණා. එක දවසක් ඇවිත් පොඩි ප්‍රමාණයක් කපලා ගිහින් තිබුණා. සාලින්ද මන්ත්‍රීතමා දවස් දෙක්ක එවලා තිබුණා දෙකේම වෙන වෙන පාරවල් කපලා ඊට පසු පොඩ්ඩක් කපලා ගියාට අවශ්‍ය ටික කෙරුනේ නැහැ. එහි දැන් අඩි 6 ක් උසට ඉලුක් වැවී තිබෙනවා.
එතනදී වේන් දෙකක් කඩාගත්තා.අදටත් ඒ වෙල මැද අඩි 75 ක ප්‍රමාණයක් ඉතිරිවී තිබෙනවා.  ඒටිකට ක්‍රමවේදයක් ලෑස්ති කරලා දෙන්න. යම්කිසි වැඩකට යනවානම් ඒ පාර කම්කරු අයට වැඩ අධීක්ෂණයට හෝ කෙනෙක් පත්කර ඒ කටයුතු කරන්න කියා මතක් කරනවා.
කුඩු කියන ප්‍රශ්නයටත් පොලිසි තුනේ ස්ථානාධිපතිවරු ගෙනත් හෝ සාකච්ජාකර වැඩ පිළිවෙලක් හදන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬවෙනවා.

<u>ගරු මන්ත්‍රී ඩී.සමන්ත රංජන් මහතා (ජ.වි.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, අද දවසේ බොහෝ දෙනෙක් සභාවේ අදහස් දක්වනු ලැබුවා. මටත් පුංචි කාරණා කිපයක් කතා කිරීමට තිබෙනවා. පසුගිය මාසයේ මුදල් කමිටුව රැස්වූ අවස්ථාවක ජයන්ති හංදියේ වැවල පාර කියන කොටස ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඔබතුමාගේ අවධානය යොමු කළා. එය ඉටුවී නැති බව මතක්කරනවා.
කිඹුල්විලවත්ත ප්‍රධාන මාර්ගය කාපට්කර සකසා තිබෙනවා. මොනයම් හේතුවක් නිසා හෝ ස්ථාන කීපයක බෝක්කු ඉදිකිරීම සඳහා ඉතිරිකර ඇති කොටස් දෑන් පාර අබලන්වෙලා තිබෙනවා ඒ ටික යන්න බැරිවෙන්න. කාරණය ඒක නොවෙයි ඒවා සැලසුම් සහගත ගම්මාන නිසා ප්‍රධාන මාර්ගයට සමාන්තරව අක්කර දෙකෙන් දෙකට අතුරු මාර්ග සම්බන්ධවෙනවා ප්‍රධාන මාර්ගයට. දෙහිගස්හේන පැලකැල්ල සිට මොරහේන දක්වා කොටසේ අතුරු මාර්ග 6 ක් විතර ප්‍රධාන පාරේ සිට ප්‍රවිෂ්ඨ වෙනකොටම අඩි 1 1/2. 2 වතුර වලවල් තිබෙනවා. කිඹුල්විලවත්ත මහා විද්‍යාලයට මෙහායින් තිබෙන 6 වන පටුමග ,කිඹුල්විලවත්ත මහා විද්‍යාලයේ පිටුපස ප්‍රවේශ මාර්ගයේ කනත්ත පාර කියන කොටසේ අඩි 2,3 ක විතර ලොකු වතුර ප්‍රමාණයක් එකතුවෙනවා ඒ ප්‍රවේශ මාර්ගය පාවිච්චි කරන්න බැහැ. කිඹුල්විලවත්ත විහාරස්ථානය පසු කොට තිබෙන අමල් මහතාගේ ලී මෝලට යන මාර්ගය අඩි 2 1/2 ක විතර ගැඹුර කාණුවක් සෑම වර්ෂාවකටම සැකසෙනවා.වැලි කොට්ට දාලා ලී කොටන් දාලා  ඔවුන්ගේ ව්‍යාපාරික අවශ්‍යතවයට හදා ගන්නවා. එහි ගැටලුවක් තිබෙනවා. මම ඒ අපහසුතාවයට පත්වු අයගේ ඉල්ලීම් ලිපියක් මම මීට පෙර සභාවට  ඉදිරිපත් කළා. කාපට් මාර්ගයේ දර්ශනීයවත්ත මංසන්ධිය ඔබතුමා එක්ක අපි ගිහින් පරික්ෂා කරපු අපි කෝනක්‍රීට් කරපු මාර්ගයේ ගොමවල දෙසට යන මාර්ගයේ බුදුමැදුර ළඟ ඒ නිවස සම්පූර්ණයෙන්ම ජලයෙන් යටවෙනවා. නිවසටත් බුදුමැදුරටත් ප්‍රවේශ වෙන්න බැහැ. අජන්තා මන්ත්‍රීතුමියත් දන්නවා ගිය වර්ෂයේ ආ ප්‍රතිපාදන වලින් ලක්ෂ 30 ක් වෙන්කර කොන්ක්‍රීට් කළ ගොමවල දක්වා කැරගල මාවත මේ වනවිට වැස්ස ඉවරවෙලත් සතියක් විතර යනකම් වතුර පාර යන්නේ ඒ කොන්ක්‍රීට් මාර්ගය මතින්. අපේ කම්කරුවෝ යොදවලා ඒ මාර්ගවල කාණු ටික පිළිසකර කරන්න පුලුවන්නම් වටිනවා. කලින් කියපු තැන් ටිකට ලොකු පිරිවැයක් නොදරා කම්කරුවෝ යෙදවා හෝ ABC  ටිකක් දාලා හෝ ඒ අතුරු මාර්ග පිළිසකර කරන්න හැකිනම් වටිනවා.

පහල දොම්පෙ සමන්ත මහතාගේ බ්ලොක් ගල් වැඩපල අසලින් පහලට දිවෙන අතුරු මාර්ගයක් තිබෙනවා. ස්විස්ටෙක් ආයතනය ගැන.මම මීට පෙරත් මේ ගැන සභාවේ අදහස් ප්‍රකාශ කළා.මේ වැහි කාලයේ ඒ කොටස භාවිතා කිරීමට බැරි තත්වයක් තිබෙනවා. ඒ අයගේ ඉල්ලීමත් මම මේ වෙලාවේ ඉදිරිපත් කරනවා.
විශේෂ ස්තුතියක් කළයුතුයි.අපේ සරත් ගාමිණී මන්ත්‍රීතුමා මේ කාරණය සම්බන්ධයෙන් සැලකියයුතු මැදිහත්මක් කළා .ඔබතුමාගේ නායකත්වයෙන් පසුගිය දිනක පැවති සාහිත්‍ය උත්සවයේදී අපේ ප්‍රදේශයේ කීර්තිමත් කලා ශිල්පියෙක් වු අජිත් ඉදුනිල් පෙරේරා මැතිතුමාට සියනෑ  ප්‍රසාදිනී ගෞරව ප්‍රනාමය ලැබී තිබෙනවා.  ඒ සඳහා මැදිහත්වූ සරත් ගාමිණී මන්ත්‍රීතුමාට ,ඔබතුමාට, ප්‍රාදේශීය සභාවට එවැනි නිරහංකාර කලා ශිල්පීන් අගය කිරීම සම්බන්ධයෙන් ගෞරවය ස්තුතිය පලකරනවා.

පහල මාපිටිගම අජන්තා  මන්ත්‍රීතුමියගේ නිවස ආසන්නයේ නවගමුවට හැරෙන තැන පොඩි ඉඩම් කට්ටියක් වෙන්දේසිකර තිබෙනවා. එහි ඉඩම් මිනිසුන් මිලට අරගෙන තිබෙන අතර දැන් ඉදිකිරීම් කරන්න විදුලිය ගන්න ගියවිට මෙය අනුමත නැහැයි කියලා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය මුදල් ගෙවා නැහැ. විදුලිය දෙන්න විදුලිබල මණ්ඩලය එකඟ වී නැහැ.
මේ කාර්යාලයේ පවත්වගෙන යන ඉඩම් වෙන්දේසි ආයතනයකින් කඩවත ප්‍රදේශයේ මගේ ඥාති දියණියක් ඉඩමක් මිලදී ගත්තා. අදටත් ඒ ඉඩමත් අනුමත කර නැති නිසා වීරිරේඛා සහතික ගන්නවත් ලැබුනේ නැහැ.
මෙහි අපි ඉන්නවා මේ ආයතනය තිබෙනවා .නමුත් මිනිසුන්ට ඕන විදිහට මේ ජාවාරම් කරගෙන යනවා. ඒ ඉඩම් කට්ටි කිරීම සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමුකරනවා.

අද දවසේ අපි හැමෝගෙන්ම එන්නේ යම් අදෝනාවක් තමයි කියා රාජු මන්ත්‍රීතුමා කිවුවා. මේ තියෙන තත්වයත් එක්ක අදෝනාවල් වෙනවා.  සාලින්ද මන්ත්‍රීතුමාගේ කතාවේ මුල් කොටසේ  අපිට ගතයුතු සාධනීය අදහසක් ඉදිරිපත් වුනා.අපි ව්‍යාපෘති ප්‍රමුඛතාවයක් අරගනිමු. අපේ බල ප්‍රදේශයේ තිබෙන බහුතරයක් ජනතාව පාවිච්චි කරන වැලිවත්ත මාර්ගය ඒ ව්‍යාපෘතිය කෙරෙන්නේ නැතිනම් නදීකා මන්ත්‍රීතුමිය කිවුවා වගේ ලක්ෂයක් දෙකක් දාලා ප්‍රිමික්ස් ටිකක් දාලා හැදියහැකි දෙයක් නෙවෙයි. සභාවේ හැමකෙනාගේම එකඟතාවයෙන් අත්‍යාවශ්‍ය මුදලක් වෙන්කර ඒ මාර්ගයේ යන්න පුලුවන් තත්වයට සකස් කරමු.සාලින්ද මන්ත්‍රීතුමාගේ ඒ සාධනීය අදහස ඒ විදිහට අගය කරනවා.

පසුගිය මම සම්බන්ධ නොවු සභාවේ වාර්තාව කියවද්දී මේ සභාවේ හිටපු ගෞරවනීය නායකයෙක් වු සනී ජයවර්ධන මැතිතුමා දීර්ඝ අදහසක් ඉදිරිපත්කර තිබුණා. සනී ජයවර්ධන මැතිතුමා, උභයකුමාර ජයවර්ධන මැතිතුමා,ඔබතුමා ඇතුලු මෙහි යම් ඉතිහාසයක් තිබෙන පිරිසක් පිළිබඳව මගේ පුද්ගලික අදහසක් තිබුණා ඔවුන්ගේ දේශපාලන මතවාදවලට එකඟ නොවුනත් .
අද රටේ ප්‍රශ්නයක් තිබෙනවා. අපි නියෝජනය කරපු මිනිසුන්ට ප්‍රශ්න තිබෙනවා. අපිට ඒවාට උත්තරයක් දෙන්න බැරි තැනට අපි හිරවෙලා තිබෙනවා.හිරවු සමහර කාරණා අපිට විසඳගන්න බැහැ ජාතික තලයේ ප්‍රශ්න. ඉදිරියේදී අපේ අයවැය එනවා. අපි කොහොමද අපේ සභා බල ප්‍රදේශය ඇතුලේ අපේ අරමුදල් යොදවමින් අපිට ලැබී තිබෙන සම්පත් ටික අපි කළමනාකරණය කරගන්න මැදිහත් වුනේ සහ නොවුනේ  කියන කාරනා පැහැදිලි කරගන්න තිබෙනවා. පසුගිය සනී ජයවර්ධන මැතිතුමාගේ කතාවට උත්තර සපයමින් ඩග්ලස් මන්ත්‍රීතුමා මේ සභාවේ එහෙම පත්වු ගරු සභාපතිවරුන්ගේ යම් යම් ක්‍රියාකාරකම් සම්බන්ධව දක්වා තිබුණා. මේ ගොඩනැගිල්ලට සනී ජයවර්ධන මැතිතුමාගේ මැදිහත්වීම සහ එතුමා ඉතිරි කරගත් යම් මුදල් ප්‍රමාණයක් සහ මෝටර්ග්‍රේඩර් වගේ උපකරණ ගත් එක,පැල්පිට ආදාහනාගාරය නිර්මාණය කිරීම වැනි මතක සිටන ක්‍රියා අපිට ඉතිරිවුනු බව.

මට තිබෙන්නේ එතනින් එහාට වෙනත් ප්‍රශ්නයක්.අපිට ලැබුණු බස්නැවතුම්පල වෙනත් අපිට ලැබුණු ඉදිකිරීම් අපි හරි උපයෝගීතාවයකින් ඒවා නඩත්තු කරමින් ඒවායේ ආදායම් උත්පාදනය කරන විදිහට අපේ පරිපාලනයට  නතුවු සමහර ස්ථාන හරි උපයෝගිතාවයෙන් පාවිච්චි කරනවාද කියන එක ගැන ගැටලුවක් තිබෙනවා. මෑත කාලයේ එවැනි සන්කේත ඉදි නොවු බව එතුමගේ කතාවෙන් පැහැදිලිකර තිබුණා. මා අදහස් කරන්නේ අපි සභාවක් හැටියට අපිට එන අභියෝග අපි ජයනොගත් අදහසයි. ජාතික දේශපාලනයේ කතා කරගන්න ඕනතරම් දේවල් තිබුණත් මම ඒවා කතා කරන්න යන්නේ නැහැ. රාජු මන්ත්‍රීතුමා යම් උද්වේගකාරි අදහස් දැක්වීමක් කලා.මම එවැනි අදහසකට යන්නේ නැහැ. ඊළඟ සභාවේදී ඔබතුමාගේ උපදේශකයෙක් බංගලාදේයෙන් හෝ මාලදිවයිනෙන් පත් නොවේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, පසුගිය සභාවෙදී ප්‍රිමික්ස් යාඩ් එකේ ට්‍රැක්ටරේ අනතුරක්  පිළිබඳව සභාව දැනුවත් කළා.  සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ ඒ ගැන සානුකම්පිත අවධානය යොමුකරලා මුදල් ලබාදුන්නා.රු.35000 ක මුදලක් එකතුවුනා. සභාපතිතුමාගේ උපදෙස් පරිදි ඒ මුදල මේ විදිහට ලබාදෙන්න කටයුතු කළා.  නීලක  ප්‍රසන්න මයා මේ වනවිටත් රෝහල්ගතව සිටිනවා ඔහුට රු.10000/- කුත් ධර්මසිරි මයාට රු.5000/- කුත් නිමල් කරුණාතිලක මයාට රු.5000/- කුත් සමීර නිශාන්ත මයාට රු.5000/- කුත් මධුෂාන් අබේසිරි මයාට රු.5000/- කුත් මහේෂ් මයාට රු.5000/- කුත් වශයෙන්. මේ පිළිබඳව සානුකම්පිත අවධානය යොමුකර ලබාදුන් සහයෝගය පිළිබඳව කර්මාන්ත කමිටුවේ සභාපති වශයෙන් ඒ සියළුම මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවනීය ස්තුතිය පුදකනවා.

<u>ගරු මන්ත්‍රී නිශාන්ත අනුරජිත් වෙඩිසිංහ මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, මේ සභාවේ පුගොඩ උප කාර්යාලයේ  සෞඛ්‍ය කම්කරුවෙක් විදිහට කටයුතු කළ අජිත් කියන අයෙක් පුගොඩ ප්‍රදේශයේදී අනතුරකට ලක්වුනා. මේ සෞඛ්‍ය කම්කරුවා හප්පලා ගිය අවස්ථාවේදී මේ රෝගියා රාගම රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී පොලිසිය මේ සැකකරුවාට ඇපදී තිබුණා. එය නවත්වගන්න අපේ ප්‍රාදේශීය සභාවටත් හැකියාවක් නොලැබුණා.  අද මෙම සේවකයාගේ එක ඇහැක් සම්පුර්ණයෙන් නරක් වෙලා.  මොහු සේවය නිමකර ආපසු කරන්නේ ත්‍රීවිල් එක හයර් කරන එක. ඊට අමතරව පොල් ලී පැලුවා. ජීවිකාව කරගෙන ගියේ ඒ ආකාරයටයි. අද මේ පුද්ගලයාගේ ඇසක් පේන්නේ නැහැ.  මාසයට දවසක් හෝ දෙකක් ඇහැට ප්‍රතිකාර ලබනවා කුරුණෑගල හෝ අනුරාධපුරය ප්‍රදේශයේ. මේ පුද්ගලයාට ප්‍රතිකාර කිරීමට ත්‍රීවිල් එකක් රැගෙන යාමට විශාල මුදලක් දරන්න වෙනවා. සභාවෙන් මේ ප්‍රතිකාර ගන්න යන්න ත්‍රීවිල් රථයක් ලබාදෙන්න කියා යෝජනා කරනවා.

දැනට මේ පුද්ගලයාට ටික වෙලාවක් හිටගෙන සිටියදී ක්ලාන්තය හැදෙනවා. මොහුව පූගොඩ උපකාර්යාලයෙන් සේවයට යවනවාලු. මේ සේවකයා කාර්යාලය තුල සේවයට යොදාගෙන සෞඛ්‍ය කටයුතු සඳහා එලියට යවන එක වලක්වා සභාවෙදී සිදුවූ සිදුවීමක් නිසා ඒ කටයුත්ත සිදුකරන්න කියා ඉල්ලමින් මම නිහඩවෙනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතුමනි, එයාට ඒ දවස කියන්න කියන්න .මම සභාවේ වාහනයක් ලබාදෙන්නම්.මේ කුණු ට්‍රැක්ටරයි ගිය කෙනා පිටිපස්සෙන් ඇවිත් හැප්පුවා. පොලිසියෙන් ඇප ඉල්ලුවා. මම එතන ඉඳලා ඊට විරුද්ධ වෙලා ඒ පුද්ගලයා රිමාන්ඩ් ඇරියා. මට ඒ වෙලාවේ කළහැකි දේ කළා.

<u>ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, පසුගිය ඔක්තෝම්බර් මාසයේ අපේ සාහිත්‍ය උත්සවය උත්කර්ෂවත් අන්දමින් සාර්ථකව පැවැත්වුවා. ඊට සම්බන්ධ වුනු ගරු සභාපතිතුමා ඇතුළු උපසභාපතිතුමා විපක්ෂනායකතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට මගේ ස්තුතිය පිරිනමනවා. ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පිරිනමනවා. රංජන් මන්ත්‍රීතුමා පැවසුවා අර ප්‍රවීන අජිත් ඉඳුනිල් මහත්තයාට සියනෑ ප්‍රසාදිනී සම්මානය දුන් එක ගැන. මගෙනුත් එහි විශේෂ ගෞරවය හිමිවිය යුතුයිඅපේ ගරු සභාපතිත-මා ලේකම්තුමා ඒවගේම අපේ ප්‍රජා සංවර්ධන නිලධාරී ජයතිස්ස මහතාට. අපි ගොඩක්කල් කියලා හැම මන්ත්‍රීවරයෙකුටම ලිපියකින් දැනුම් දුන්නා මේ අවස්ථාවට සම්බන්ධ වෙන්න කියලා. එතනට සම්බන්ධ වෙන්න බැරිවෙන්න සාධාරණ හේතු තිබෙන්න ඇති. ගාමිණී මන්ත්‍රීතුමා කිවුවා මට හදිසි අවශ්‍යතාවයක් තිබෙනවා එන්න වෙන්නැති බව. අපේ දෙයක් වෙලාවට අපි නැති එක කණාටුවට කරුණක්.
මීට පස්සේ එහෙම දේවල්වලට සම්බන්ධ වෙන්න. අපේ අයට වඩා හිටිවේ විපක්ෂයේ මන්ත්‍රීවරු. ඒකට මම ගොඩක් සතුටුනෙවා. ඒ කටයුතු සැලැස්මක් අනුව සිදුවුනා. එදා උපකාර්යාලයේ වාහන පාක් කරලා තිබ්බෙත් හරි පිලිවෙලට. ප්‍රධාන දේශක ස්වාමින් වහන්සේ ඇවිත් යන්න හදනකොට වාහනේ ටක්ගාලා එතන..එතනදී අනුරාධට ස්තුති කළයුතුයි. වාහන ටික ගානට පාක් කරන්න දී තිබුනේ ඔහුටයි.උත්සවයට සමබන්ධව වැඩ කරපු හැමෝටම නැවතත් මම ස්තුතිවන්තවෙනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීවරු ඉඩම් වෙන්දේසිය ගැන කතා කළා. මමත් මේ ප්‍රාදේශීය සභාවට ආ දවසේ ඉඳන් මේ ගැන කතා කළා. එක වරක් දොම් දොම් දොම්පෙ කියා බැනර් එකක් ගහලා තිබුණ. සනී ජයවර්ධන මැතිතුමා හිටියේ සභාපතිවෙලා. එතුමා මැදිමත්වෙලා පසුවදාම ඒ බැනර් එක අයින් කළා. ඒ බැනර් එක ඒ විදිහට ගහලා තිබුනේ දොම්පෙට අප කීර්තියක් වෙන්න තමයි. රබන් පදයක් විදිහට ගහලයි තිබුනේ. මේ අවුරුදු 5 විතරක් නොවෙයි එදා ඉඳන්ම ඔහොම තමයි.

මම පසුගිය සභාවෙත් කතා කළා ගරු සභාපතිතුමනි මමයි ජානක මන්ත්‍රීතුමයි පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යලට ගිහින් ලියුම් භාරදුන්නා සමනබැද්ද මල්වාන පාර ගැන. සමනබැද්ද සමෘද්ධි බැංකුව අසල, සමනබැද්ද හෝටලය අසල විශාල වළවල් හැදිලා කාපට් පාරේ ඒ ටික හදලා දෙන්න කියලා. මාර්ග සංවර්ධන අධිකාරියෙන්වත් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් හැදෙන්නෙත් නැහැ. අර කිවුවා වගේ ප්‍රාදේශීය සභාව ඊට වඩා ඉදිරියෙන් ඉන්නවා. ඔබතුමාට කිවුවහම කරලා දෙනවා. ඒවගේම සභාවෙන් කෙරෙන වැඩක් වුනත් මන්ත්‍රීවරයා ඉන්න ඕනෑ ඉස්සරහ. මන්ත්‍රීවරයා ඇවිත් වැඩය කරගන්න ඕනෑ. සමහරු බලාගෙන ඉන්නේ එදාට විතරක් මෙතනට ඇවිත් කියලා සභා වාර්තාවේ පිටු වැඩිකරන්න. අපේ මන්ත්‍රීවරු දැනගන්න ඕනෑ ඇවිත් සභාපතිතුමා එක්ක කතාකර වැඩය කරගන්න. ඉලුක් එහෙම අපි කියලා කපාගත්තා. මෙතන ශක්තිමත් සභාපතිවරයෙක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ 25 ක් ඉන්නවා මන්ත්‍රීවරු. විපක්ෂයක් තිබෙනවා. ශක්තිමත් සභාවත් තිබෙන්නේ. ලේකම් මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. අපි කවදාවත් අඳෝනා කිවුවේ නැහැ. බැරිනම් බෑ කියලා යනවා. නැතිනම් මිනිසුන්ට එපා කියලා කියනකම් ඉන්නවා. මම අපේ මන්ත්‍රීවරුන්ට කියන්නේ අඳෝනා කියන්න මෙතනට එන්න එපා. අපි ගමේ අඳොන් කිව්වෙත් නැහැ. මෙතන ඇවිත් කිවුවෙත් නැහැ. සර්ව සම්පූර්ණ සභාවත්වත් ආණ්ඩුවක්වත් තිබුනේ නැහැ. ප්‍රශ්න තිබුනා. හැමෝම කියන්නේ මීට කලින් කිබුන ඒවා හරි සම්පූර්ණයි කියලයි. අපිට ගන්න දෙයක් ඉතුරුවී තිබුනේ නැහැ ගෝඨාභය මහත්තයා එනකොට.

(සභාවේ ඝෝෂා )

අපේ මන්ත්‍රීතුමා පාසල් ගැන කිවුවා. ගුරුවරුන්ගේ සාරිය ගලවන්න හදනවා කියලා. අපි ඉස්කොලේ යන කාලේ ගුරුවරු සැතපුම් 4,5 සාරිය ඇඳගෙන ආවා. සාරියක් ඇඳන් ගුරුවරයෙක් පාරේ යනකොට කවුරුවත් වචනයක් කිවුවේ නැහැ. එනිසා ඒකටත් අපි විරෝධය පලකරනවා.

ඒවගේම අපේ ප්‍රදේශයේ ඩයලොග් සන්නිවේදන කුළුනකින් අකුණු සැර එම ප්‍රදේශවලට පතිතවෙනවා කියලා ජනතාව කියනවා. මම දන්නේ නැහැ ඒකේ තාක්ෂණික පැත්ත ගැන. සමනබැද්ද ප්‍රදේශයේ තිබෙන කණුවල මේ වෙනකොට පිච්චිලා ගිහින් තිබෙනවා. ඒ ගැන එම ආයතනය දැනුවත් කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා ( ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, මේ අරගලය පස්සේ තමයි කුඩු වැඩිවුනේ. එදා පොලිසිය රාජකාරි කරනවිට පොලිසියේ යුනිෆෝම් එක ගලවලා පොලිසිය හෑල්ලුකරලා නීතිය පැත්තකට විසිකර දැමුවේ ඒ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ක්‍රියා කලාපය අනුව වියහැකියි. අද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අතට ගත්වෙලාවේ සිට නීතිය අකුරටම කළා. මට වෙලාවකට හිතෙනවා ප්‍රභාකරන් මැරුවේ ඇයි කියලා. මේ රට ප්‍රභාකරන්ට තිබුනානම් අද අපි මීට වැඩිය ලස්සනට ජීවත්වෙනවා. මම යුද්ධය ඉවරවෙලා යාපනේ ගියා.එතුමා හදපු පලතුරුවත්ත අක්කර 200යි.
ඊට පසු මම ආයි අවුරුදු 4 කින් විතර ගියා. එතකොට ඒක විනාශ කරලා.විශාල ආදායමක් ගත් තැනක්. ඒ සාපෙද මන්දන්නෑ අපිට වැදුනේ කියා මට සිතුනා.මේ අරගලයෙන් පස්සේ තමයි කුඩු වැඩිවුනේ. මගේ ව්‍යාපාරවලට ගිනි තියන්න ආව අය තමයි අපිට කුඩු ගෙනක් දුන්නා බොන්න කියා පාපොච්චාරණය කළේ. මම ඒ මිනිසුන්ට අනුකම්පා කරනවා. ඒවා බීලා තමයි මෙහෙම කළේ කියලා. දැන් අපේ පවුල් අනාතවෙලා තිබෙන්නේ කියලා කිවුවා. අපේ දේපල පැහැරගෙන යන්න කියලත් උපදසේ දුන්නලු. මගේ ව්‍යාපාරයේ ලක්ෂ 70 ක විතර බඩු අරගෙන ගිහින් තිබුණා. අර ඉන්දියන් කෙනාගේ ගේ ඉස්සරහ ඇළුමිනියම් වැඩපලේ රු.4900/- ප්ලේට් එකක් ප්ලේට් 6360 ක් පටවාගෙන ගිහින් තිබුණා.අරන් ගිහින් තිබෙන්නේ කැමරා ටික කුඩු කරලයි. මේවාට මූලිකත්වය ගත් අය කනබොන වෙලාවට ආපහු කියනවා. මගේ පුතා කිසිම දේශපාලනයට යන්නේ නැහැ. පුතාගේ ලොරි 7 ක් තමයි කුඩු කළේ.. ටයර්,ස්පෙයාර් පාට්ස් අරගෙන ගිහින් තිබුණා,කැමරාත් කුඩු කරලා තිබුණා.

2015 තමයි මේ සභාවේ විනාශයට මුල වුනේ. මන්ත්‍රීවරු වෙනස් කළේ පනත් ගෙනත්. ඒ කාලයේ හිටපු දේශපාලන පක්ෂවලට අවශ්‍ය විදිහට මනිත්‍රීවරු වැඩි කරගෙන ප්‍රාදේශීය සභාව සුදු අලියෙක් මට්ටමට ගෙනාවේ ඒකෙන්. ඊට පස්සේ නිලධාරියා දේශපාලඥයා හැටියට පිහිටවුවා. දෙගොල්ලේ ඝට්ටනය වුනා. එතකොට නිලධාරීන්ට දෙයියන්ගෙම පිහිටයි. ගරු සභාපතිතුමනි, අපිට ව්‍යාපෘති කරගන්න පුලුවන් වුනාද, පාරවල් බලලා ටක්ගාලා ඉස්සර ඇස්තමේන්තු හැදුවා. අද මට ණය හිමි කරපු ටිකේ ඇස්තමේන්තු හදාගන්න බැරිව ඉන්නේ. අද තිබෙන මිල අනුව කොන්ත්‍රාත්කරුට ව්‍යාපෘති කරන්න ඇස්තමේන්තු හදලා දියයුතුයි. ඒක හොරකම් නොවෙයි . හදන තාක්ෂණ නිලධාරිලා දන්නවා මෙය කරන්නේ කොහොමද කියලා. ගස් සිටුවන්න කියලා එනවා පාරවල්වල. අඩි 12 පළලට කොන්ක්‍රීට් දැමුවිට ගස් සිටුවන්න වෙන්නේ කාණුවේ තමයි. අපිව ඇදලා දැමුවේ ඒවගේ යුගයකට තමයි.
දංගල්ල උඩුගම පාරේ යන්නම බැහැ. කඩාගන ගිහින් තිබෙනවා. දෙපැත්තේ කැලෑවත් වැවිලා තිබෙනවා. ඒටික මට සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රිනී ප්‍රසාදිනී කාරියවසම් මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, අපි පසුගිය මාසයේ 23 වෙනිදා රදාවාන කොට්ඨාශයේ කලාකරුවන් ඇගයීමේ උත්සවයක් පැවැත්වුවා. විශේෂයෙන් සියනෑ කෝරලයේ ජීවත්ව සිටියදී කලාවට සාහිත්‍යට මහඟු සේවයක් කළ කලාකරුවන් 12 දෙනෙක් ඇගයීම තමයි ඒ උත්සවයේ පරමාර්ථය වුනේ. අපි ඔවුන්ගේ ඥාතීන් කැඳවා පුන්‍යානුමෝදනාවක්කර රටේ අග්‍රගන්‍ය සාහිත්‍ය කරුවෙක් වන මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහත්මා ගෙන්වා විශේෂ සාහිත්‍ය දෙශනයක්කර සාර්ථකව ඒ උත්සවය නිමා කළා. අපිට ඒ බාධක ජයගන්න විශාල ශක්තියක් වුනා අපේ හරෂණ රාජකරුණා මැතිතුමා වගේම අපේ ගරු සභාපතිතුමා අපි කියන සැනින් සහ අපේ අවශ්‍යතා මොනවද කියා සොයා බලලත් ,ලේකම්තුමා ඇතුලු කාර්ය මණ්ඩලයත් අපේ කටයුතු සාර්ථක කරගන්න දැවැන්ත ශක්තියක් වුනා හ් ගැන විශේෂ ස්තුතියක් කරනවා. අපේ විපක්ෂනායකතුමා සියනෑ කෝරලයේ සියලු පක්ෂ විපක්ෂ කලාකරුවන් ඒකරාශී කරගෙන කලාසංසදයක් පිහිටුවලා ඇගයීමට ලක්කරන්න දැවැන්ත මෙහෙවරක් කළා. ඒ පිටුපස අපේ පක්ෂයේ මලින්ද මන්ත්‍රීතුමා, දමිත් මන්ත්‍රීතුමා, ඩග්ලස් මන්ත්‍රීතමා ඇතුලු අපේ පක්ෂ මන්ත්‍රීවරු ඇතුලු සියලු පක්ෂ විපක්ෂ සියලුදෙනා තමන්ට හැකි අයුරින් දායකත්වය ලබාදන්නා. ඒ පිළිබඳවත් නැවත වාරයක් ස්තුතිකරනවා.

අපේ සරත් ගාමිණී මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ කිවුවා අපිට චෝදනා කරනවා හැමතිස්සෙම.අපි මේ වෙලාවේ පක්ෂ විපක්ෂ ගැටුම් ඇතිකරගන්න එක නොවෙයි ජනතාව මේ වෙලාවේ විශාල පීඩනයකට ලක්වෙලා තිබෙනවා.කොරෝනා ව්‍යසනය, පෝලිම් යුගය ගැන අහලා හෙම්බත්වෙලා සිටින්නේ. කොරෝනා ව්‍යසනයට පත් වුනේ අපේ රට විතරක් නොවෙයි අපේ හැම පක්ෂයකම නායකත්වය දැනුවත්කර ගම්වල අපේ ජනතාවට තිබෙන ගැටලු හඳුනාදී ඉදිරියේදීවත් රට ගැන සිතන ජනතාව ගැන සිතලා කටයුතු කරන්න හැම පක්ෂයකම බිම් මට්ටමේ ජනතා නියෝජිතවරු වශයෙන් හරි දේ දකිමු කියන එක යෝජනා කරනවා.\

ඒවගේම අපේ ගරු උපසභාපතිතුමා ප්‍රභාකරන් කියන නායකයා ගැන දෙපාරක්ම එතුමා අගය කිරීමට ලක්කෙරුනා. ප්‍රභාකරන් කියන පුද්ගලයා පලතුරු අක්කර 200 වැවුවට වැඩිය අපෙ ටට කරපු විනාශය ගැන කියා නිමකරන්න බැහැ. අද රට මේ තත්වයට පත්ව තිබෙන්නේ අපේ හැම පක්ෂයකම රටට වැඩක්කළ වටිනා නායකයින් ඝාතනය කළා.විශේෂයෙන් ගාමිණී දිසානායක මහත්තයා. කදිරගාමර් මැතිතුමා,ප්‍රේමදාස මහත්තයා වැනි රටට වැඩක්කළ හොඳ නායකයින් විශාල ප්‍රමාණයක් ඝාතනය කළා. රටේ සම්පත් විනාශ කළා.ජාතික ධනය නැති කළා මේ පුද්ගලයා වවපු අක්කර දෙසීයට වැඩිය. මහ විනාශයක් කළා.

ගරු මන්ත්‍රී කේ.ඒ.කරුණාජීව මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, මම සභා වාර කීපයක් නිහඬවෙලා ඉඳලා මට අද සභාව ආමන්ත්‍රණය කරන්න සිතුනේ මේ සභාව තුල අපගේ දේශපාලන භූමිකාවේ අපි අපිම අපිට බැනගන්න වටපිටාවක් සැදීම පිළිබඳව කණගාටුවෙනවා. අපි මහජන නියෝජිතයින් විදිහට පත්ව සිටින්නේ අපිට ගරුත්වයක් සහ අපිට ලැබී තිබෙන තනතුර අපි ආරක්ෂා කරගන්න අපි වගබලා ගතයුතුයි.අපි සභාව තුල කතා කරන්නේ මහජන නියෝජිතයෝ ටිකට පමණක් නොවෙයි. රාජ්‍ය නිලධාරීන් සහ මාධ්‍යවේදී මහතුන් සහ අනිකුත් සියලුදෙනාත් එක්ක. අපි මේ කතාකරන දේ සමාජගතවෙනවා. අපි මේ සභාව තුලින් ආදර්ශයක් දෙන්නේ මොනවාද, සමාජය ගොඩදාන්නේ කොහොමද, මේ සමාජ ව්‍යසනයෙන් මිදෙන්නේ කොහොමද අපි යායුතු එතනටයි. ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන  රටක අපිට මේ තත්වය උරුම වී තිබෙන්නේ මේ  ව්‍යවස්ථාව. අපේ මේ දේශපාලනය තුල අපි මේ කතාකරන සෑමදේම ජනතාවට සුභවාදී වියයුතුයි. අපි සමාජය තුල සිටියයුතු වන්නේ හරි තැන.
අපි නිවැරදිභාවයක් නැතිව අපි හොඳයි කියා අපිට කියන්න බැහැ. මොන අඳෝනා ගැහුවත් මොන දේ කළත් අපි ප්‍රාදේශීය සභාව තුලින් ආදර්ශමත් නායකයෝ කියන එක දොම්පෙ ආසනයට රටට ලබාදිය යුතුයි.  මට වුනදේ මට කරපු දේ කියා මෙතන කතා කරන්න එපා. අපි එතනින් ඔබ්බට ගිහින් අපි මේ සමාජයට දායකවන්නේ කොහොමද කියන එකට අපි යායුතුයි.
විදුලියගැන ,අධ්‍යාපනය,ක්‍රීඩාව ගැන කතා කළා. අප විදුලිය ගැන මුලින්ම ගත්තොත් මේ පැවතුනු සභාවල් සෑම එකකින්ම අපිට දේශපාලනය කරන සෑම කෙනාටම උදව්කළ අයෙක් ඇද්ද අපි එතනට ලයිට් දාන්න යනවා. අපි මේ සභාව තුලින් ඒ පිලිබඳව ප්‍රතිපත්තියක් මේ සභාව තුලින් ගෙනායුතුයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ටත් වෙලා තිබෙන්නේ ඔය කර්තව්‍ය තමයි.වැලි ගොඩදාන,ගල්කඩන,පස්කපන සහ අනිකුත් අකටයුතු ව්‍යාපාර කරන සියලුදෙනාත් දේශපාලකයාට එකතුවෙනවා. දේශපාලකයාට අතකොලුවක් වෙලා දේශපාලකයාට දේශපාලනය හරියාකාරව  කරන්න දෙන්නේ නැහැ ඒ අයයි මේ රට  ගෙනියන්න හදන්නේ. අද වෙලා තිබෙන්නේ ඒකයි. අන්න ඒ දේශපාලන හේතු කාරණාව නැති කරනකම් මේ දේශපාලන ධාරාව තුලින් මේ රට ගොඩගන්න බැරි බව මගේ අදහස.

අධ්‍යාපනය ගැන සාලින්ද මන්ත්‍රීතුමා සහ අනිකුත් මන්ත්‍රීවරු කතා කළා. අපේ හිටපු නායකයෝ හෝ කවුරු හෝ මේ කෘෂිකර්ම  විෂය මේ අධ්‍යාපන විෂය ධාරාව අයින් කිරීමේ විපාකයි මේ අද රට භුක්ති විඳින්නේ කියන එකයි මගේ අදහස. අද අවු.35 න් පහල කිසිම දරුවෙක් කැත්ත උදල්ල අල්ලන්නේ නැහැ. ගොවිතැන මොකක්ද කියා හඳුනන්නේ නැහැ. ගෙවල් වනාන්තර වගේ.අපිරිසිදුව ජීවත්වෙන්නේ. අද රට ඒ තත්වයට පත්වෙලා. එයට හේතුව කැත්ත උදල්ල දරුවන්ට නැතිකම.මගේ දරුවාට කැත්ත උදල්ල ගන්නා කිවුවාට ගන්නේ නැහැ මුලින් පුරුදු වී නැති නිසා.එය අධ්‍යාපනය තුලින් ආවා නම් ගුරුවරයා ඉගැන්වුවානම් අද ගෙදර ඇවිල්ලත් ඒ දරුවා කරනවා.
ක්‍රීඩාව ගත්තත් ඒවගෙයි. ක්‍රීඩාව තුලින් යම් කෙනෙක් රටේ ගෞරවයක් ලබනවාද එතනට වල කපන්න යම් කෙනෙක් ඉන්නවා.  මේ ක්‍රීඩාව විෂය ධාරවෙත් කවුද ඒ තැන්වලට යැවියයුතු සුදුස්සා කියා තෝරා ගතයුතුයි.  අද විනයක් නැතිව ක්‍රීඩාව තුලින් රට අපකීර්තියට පත්ව තිබෙනවා.

අපේ පාරවල්වල කැලෑව වැවිලා කියා කෑගැසුවා. ඉලුක්වැවිලා කියා සැමදාම කතා කරනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, අපි සභාව තුලින් අපි ප්‍රතිපත්තියක් ගෙනත් පාර දෑලට අයිති නිවසේවල ඒ මිනිස්සු දැනුවත්කර ඒ ගෙදර ඉස්සරහා වත්ත පිරිය මායිම ශුද්ධ කරගන්න වැඩසටහනක් ගෙනගියොත් ඔය වර්පනම් එකතු කරන්නද අවශ්‍ය වෙන එකක් නැහැ. එහෙම ප්‍රතිපත්තියක් නැහැ. අපිත් නිහඬයි, මිනිස්සුත් නිහඬයි මිනිස්සු නිකන් කන්න පුරුදු කරලා.  අන්න ඒකයි රට  මේ තත්වයට වැටි තිබෙන්නේ. මේවාට ඔබතුමාවත් මමවත් වගකිවයුතු නැහැ. ඉහල දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය නිලධාරීන් එක්ව ගත් වැරදි තීරණවල ප්‍රතිඵලය නිසා තමයි අද මේ දේ වෙලා තිබෙන්නේ. දොම්පෙ ප්‍රාදේශීය සභාව ආ ලස්සන ගමන්මග නැතිකරගන්න එපා සියලු මන්ත්‍රීවරු ඒ ගරුත්වය ආරක්ෂාකර මහජන නියෝජිතයෙක් විදිහට අපිට නැවත ගිහින් කතා කරන්න වටපිටාවක් තිබිය යුතුයි කියන එකයි මගේ අදහස. මින් ඉදිරියට මේ ගරු සභාව ගරු සභාවක් හැටියට පවත්වාගෙන යමු. මම මේ සභාවට ආවේ ජාතික ඇඳුමින්. මම ඒ ජාතික ඇඳුමින් අයින් වුනේ මේ සභාවට එය ඇඳන් එන්න තරම් ගරු සභාවක් නොවන නිසයි. වාර 6,7 ක් මේ සභාවට මම ෂර්ට් එක ඇඳගෙන ආවේ එනිසයි. මම ජාතික ඇඳුමින් ආවත්  වැඩක් නැහැ අනිත් අය අනිත් අනිත් විදිහට එනවානම්. සියළුදෙනාගේ ගරුත්වය තමයි මෙතන.

දොම්පෙ ආසනයේ අධ්‍යාපනය වෙනුවෙන් කෘෂිකර්මය වෙනුවෙන් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න.මන්ත්‍රීවරු සියළුදෙනාට ලබන අයවැයෙන් ලක්ෂ 3 ක මුදලක් වෙන්කර තිබෙනවා. ඒ මුදලින් අපිට කළයුතු දෙයක් නැහැ ගමේ. එනිසා සියලුදෙනාගේ ඒ මුදල එකතුකර දොම්පෙ ආසනයේ වියයුත්තේ කුමක්ද කියා කමිටුවක් හරහා තෝරා බේරාගෙන එය ඉෂ්ඨ කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මේ ලක්ෂ 3 න් අපිට කරන් හැකි දෙයක් නැහැ. ඉදිරියටත් දොම්පෙ සභාවේ අපි  පොදු දේවල් කරනවානම් පොදු මුදලක් යොදවා  කමිටුවක් හරහා ඒ සියලු දේවල් ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලා සිටිමින් සියලුදෙනාට තෙරුවන්සරණ පතමින් මම නිහඬවෙනවා.

ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.නි.ප.)

ගරු සභාපතිතුමනි, සභාපතිතුමා මම එතුමාගෙන් දනගන්න කැමතියි. එතුමා කිවුවා ජාතික ඇඳුම ඇඳගෙන මෙතනට ආවා දැන් එහෙම එන්නේ නැහැ සභාව කෙලෙසිලා කියා එතුමා සභාව ඇතුලේ ඉඳන් කියනවානම් එය වෙලා තිබෙන්නේ කවුරු නිසාද කියා කිවයුතුයි. එය අපි නිසා වෙලානම් අපි එය හදාගතයුතුයි.

ගරු මන්ත්‍රී චිත්‍රානන්ද ජයවීර මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි,එකක් ගියා අඳෝනාව කියනවා කියා. තමන්ට දෙන මුදලින් ගම්වල තමන්  වැඩක් කරනවානම් අපි එක එක්කෙනාට අඳෝනා කියන්න ඕන වැහැ.

සරත් ගාමිණී මන්ත්‍රීතුමා කතා කරද්දී අපේ උභය කුමාර ජයවර්ධන මහතා මෙතන ප්‍රශ්නයක් ගියා. එය පිළිගන්න ඕනෑ. 77 ආර්ථික වෙනස්කම් නිසා මේ රටට මය තත්වය වුනේ කියා කිවුවා. එය ඇත්ත 77 ඉඳන් ආව ප්‍රතිපත්තිය තමයි එක එක්කෙනාගෙන් ඇවිත් මේ රට විනාශ වුනේ. හැම පක්ෂයක්ම මෙයට වගකිවයුතුයි. අඩුපාඩු තිබෙනවා. ඒවා කවුරුත් පිළිගතයුතුයි. නැතිනම් මේ සභාව හැමදාම යන්න වෙන්නේ මේ තත්වයෙන් තමයි. බොහොම ස්තුතියි.

ගරු මන්ත්‍රිනි අජන්තා රෝහිනී මිය ( ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ තිබෙන ගැටළුවක් සම්බන්ධව කතා කළයතුයි. හෝම්ලෑන්ඩ් ආයතනයෙන් කරන ඉඩම් වෙන්දේසියේ දිසාගේවත්ත අක්කර 12 පමණ වෙන්දේසි ඉඩමේ ඉස්සර වතුර බැස ගිය් එක එක පැතිවලට. ඒ ඉඩමෙම තිබෙන වතුර දැන් අපේ ගෙවල් පාරට තිබෙන බෙනවල,දෙල්ගහකොටුව, පල්ලියවල කියන ලොකු වතුර විතරක් රැඳිලා තිබෙන ස්ථානයක් තිබෙනවා. ඒ සියළුම වතුර දැන් යොමුකර තිබෙන්නේ ඒ ස්ථානයටයි. අපේ මාපිටිගම පැත්ත හැමදාම ගංවතුරින් යටවන ප්‍රදේශයක්. වතුර ටික ගඟට බැහැලා යන ක්‍රමවේදයක් එහි හැදිලා නැහැ. ඒ ටික පහත් බිම් නිසා වතුර ටික රඳා පවතිනවා.වතුර ටික ගලා බැස්මක් නැහැ. ඒ වතුර ටික ගලා බසින ක්‍රමවේදයකට හදනවානම් එතනින් වෙලට ගිහින් වෙලෙන් ගඟට වතුර පාර යනවා. ගොවිජන සේවා එකට හෝ යොමුකර ඇළ මාර්ගය පාදා දෙනවානම් ඔය ප්‍රශ්නය වෙන්නේ නැහැ. ලොකු කර්තව්‍යයක් ඒක. නමුත් ඉදිරියේදී එය කළයුතු දෙයක්. ඒ පිළිබඳව අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී එස්.එම්.රත්නසිරිලාල් මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, පුගොඩ වෙලේ මංතීරුවක් හදලා වතුර ටික බහින්නේ නැහැ.විශාල ගැටළුවක්. ඒ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත්කර වැඩ පිළිවෙලක් යොදන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි, වර්තමාන දේශපාලනයේදී පාලම් බෝක්කු හැදුවට පාරවල් හැදුවට මිනිස්සු ජන්දෙ දෙන්නේ නැහැ. දැන් ගතානුගතික වෙලා නැහැ. ගෝඨාභය ජනාධිපතිතුමා පත්වු වෙලාවේ ඔබතුමන්ලා හැසිරුනු විදිහ මට මතක් වෙනවා. M.C.C ගිවිසුම අත්සන් කරන්න කටයුතු සූදානම් කරනවිට ඔය පුටුවේ වාඩිවී සිටි මිලාන් ජයතිලක මැතිතුමා කරපු කතාව මට මතක්වෙනවා. අද රනිල් වික්‍රමසිංහ මැතිතුමා M.C.C ගිවිසුම ගේනවා. මෙයින් ගොඩක් වරප්‍රසාද ලංකාවට ලැබෙනවාලු දැන් ගමට ගිහින් කතා කරන්නේ මොනවාද කියා ඔබලාම කල්පනා කරන්න.

යහපාලන ආණ්ඩුව කාලේ අපි කොපමණ බැණුම් ඇහුවද, මෛත්‍රීපාල මහත්තයි රනිල මහත්තතයි රට විකුණනවා හොරාකනවා සල්ලි අච්චු ගහනවා කියලා බැනුම් ඇහුවා. නමුත් ඒ කාලේ තෙල් ටික,ගෑස්,කන බොන දේවල් අඩුවට තිබුණා. මිනිස්සු වාහන ගත්තා. පඩි වැඩි වුනා. ගෝඨාභය මහත්තයා ආවාට පස්සේ ඒ මොකුත් නැති වුනා. කුඩු වැඩිවුවා. නීතියක් අධිකරණයක් නැහැ දැන්.ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් එ.ජා.ප.ට යනවලු. දැන් ඔබතුමන්ලට ඒ කාලයේ බැනපු හැටියට එ.ජා.ප. යන්න පුලුවන්ද, 2005 දී රනිල් මහත්තයට මේ රට භාරදුන්නනම් අද මේ රට සුරපුරයක් වෙලා. අද හෙටම තව ඇමතිවරු 12 ක් විතර දිවුරුම් දෙයි. මේ රට වැඩිපුරම පාලනය කළේ ජයවර්ධන පරම්පරාව,බණ්ඩාරනායක පවුල,රාජපක්ෂ පවුල හා සේනානායක පවුලයි. මෙය දැන් වෙනස් වෙන්න ඕනෑ. වලවු කාරයින්ට මේ තැන දෙන්නේ ඇයි, පුංචි මිනිහෙකට දෙන්න බැරි වුනේ ඇයි, අල්ලස,වංචාව,හොරකම නවත්වන්න බැහැ කියන මේකට ආයතන කිහිපයක් වෙනස් කරන්න ඕනෑ. මුදල් අමාත්‍යාංශය, පාර්ලිමේන්තුව ,ජනාධිපති කාර්යාලයයි මේවා ශුද්ද නොකර මේවා නවත්වන්න බැහැ. හොරකම් කරන්න මුදල් දෙන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. අනුමැතිය දෙන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන්, පාර්ලිමේන්තුවෙන්.

දැන් ඔබතුමන්ලා පොලිසිය රාජකාරියක් කරන්නේ නැහැ කියා කතා කළා. පොලිසිය කරන්නේ දැන් පොලේසියට ඕන වැඩ. ආණ්ඩුවත් වැඩ කරන්නේ පොලිසිය හරහායි. අලුත් අවුරුද්ද වෙනකොට මේ රටේ විශාල වෙනසක් වියයුතුයි.

ලුණුගම තිබෙනවා ඉඩමක්. ඉඩම මැනලා සභාවට අරගන්න. දැන් ඒ ඉඩම එක එක අය අල්ලගෙන ඉන්නවා. ලේකම්තුමා ඒ බලන්න. මාත් කිවුවා තව මන්ත්‍රීවරුත් කිවුවා. අවිස්සේවෙල්ලේ බස් එක ගැන. ඒකට ලේකම්තුමා ලියුමක් ඇරියද,

කැරගල BOI ඉඩම තිබෙනවා. ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් හමුවෙලා දේශපාලන අධිකාරියත් සමඟ ඒ ගැන කටයුතු කළා. එයට ප්ලෑන් එකක් තිබෙනවා. තව මාස 2 කින් විතර ඒ ගැන කියන්නම්. BOI ඉඩම ගැන ජනාධිපතිතුමාට ලියුමක් යවන්න යෝජනා කරන්න. අක්කර 127 ක ඉඩමක් තිබෙන්නේ. පෞද්ගලික විශ්ව විද්‍යාලයක් හදන්න යෝජනාව දාන්න ලේකම්තුමා.ජනවාරි 01 දා පටන් ගන්නවා බෙල්ලකපපු හංදියේදී ජයවර්ධනපුර රෝහලට පස්සේ දෙවෙනි රෝහල හදන්න

මුල්ගල තියන්න. ඒකට සමගාමීව අවශ්‍ය විශ්ව විද්‍යාලයක්. ඒකට පසුබිමක් විදිහට තමයි කැරගල විශ්ව විද්‍යාලය හදන්න යෙජනා කලේ. සභාවේ යෝජනා බලා කියලා දාලා ඔබතුමා මේ යෝජනාව දාන්න. මම දයාරත්න මහතත්යටත් කතා කළා. එතුමා කිවුවා යෝජනාව හදලා සතියක් ඇතුලත ජනාධිපතිතුමාට එව්නන කියලා.

ගුරුවරයෙක් දනගැස්සුව එකක් ගැන කතා කළා. ඉදිරියට තව ඔයිට වැඩි දෙවල් තව වෙනවා. බඩු මිල ඉහල යාමත් එක්ක අපාරධ එන්න එන්නම වැඩිවෙනවා. ළමෙයක් ඉස්කෝලෙට යවන්න විදිහක් නැහැ. බේත් නැහැ. මණ්ඩාවල කන්දෙවත්ත පවුලක ළමයි 2 ක් ඉස්කෝලේ යවලා නැහැ. සියනෑ පාසලට බුක් හයර් එකට රු.9000 ක් ගන්නවාලු. සල්ලි නැති නිසා ළමයා යවලා නැහැ.රජයෙන් පාන් බනිස්වල මිල අඩු කරන්න කියලා කිවුවට අඩු කරලා නැහැ. දොම්පෙ ආසනේ වෙළඳ සංගම් එක්ක කතා කරලා සභාව මේවාට මැදිහත් වෙන්න ඕනෑ.

කරුණාජීව මන්ත්‍රීතුමා කිවුවා මේ ඔක්කොම පිරිහිලා කියලා . රුපියල් දෙසීය ගානට තිබෙන ඉන්ජෙක්ෂන් එක රු.40000 ට අරගෙන. මේවා අහුවෙයි කියලා තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන දත්ත පද්ධතිය විනාශ කළේ. ඔය එකක් විතරයි. තව තිබෙනවා. මේ සෙට් එක තමයි ඕක කලේ. පාස්කු ප්‍රහාරය කළේ කවුද කියා එදත් මම කිවුවා. කරලා රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ එ.ජා.ප. ආණ්ඩුවට ඒක පැටවුවා. කුමාරිමුල්ලේ කඩු හංගලා තිබෙනවා කියලා ආමි එකෙන් පොලිසියෙන් දලා හෙව්වලා. කුමාරිමුල්ලේ මුස්ලිම් මිනිස්සු ආරක්ෂා කරනවා කියලා මාවයි හර්ෂණ මහත්තයයි පතුරු ඇරියා

අද කෝටි ගානක් හොරකම් කරලා කියලා ගැණු කෙනෙකුයි හාමුදුරු නමකුයි අත් අඩංගවට ගෙන තිබෙනවා. අද කිරිඳිවලදී කෝටි ගානක් හොරකම් කරපු රදාවාන් ගැනු කෙනා ගැන කතා කරන්නේ නැහැ. එක පොලිස් කාරයෙක්වත් බැලුවේ නැහැ ඒ ගැන. දන් මැති අමතිවරු කෝටි ගණන් සල්ලි ගන්නවා. අර ශාන්ත මන්ත්‍රීතුමාගේ බස් එකට කීයක් ගෙවුවද අපේ දේපලවලට අලාභහානි වුනු මන්ත්‍රීවරුන්ට ගෙව්වද, දන් අපේ කලා සංගමයෙන් ලොකු වැඩක් එදා කළා. ඔබතුමාට ස්තුතිවන්තවෙනවා ඒකට ආවට. සමහර මන්ත්‍රීවරු ආවේ නැහැ. එක එක්කෙනාගේ දේශපාලන මතවාද තිබෙනවානේ කියලා. එතන දේශපාලනයක් තිබුනේ නැහැ. කලා වැඩකට දේශපාලනයක් නැහැ. ඒ නිසා දක්මක් ඇතිව වැඩ කරමු කියා ඉල්ලා සිටිමින් මම නිහඩවෙනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීවරුනි, අපි ජාතික ප්‍රශ්න විශාල වශයෙන් මෙතන අද කතා කළා.පාසල් දරුවන්ගේ දඩුවම් කිරීමේ සිටන්. ජාතික ප්‍රශ්න අද මෙතන කතා කළයුතුව තිබෙන්නේ වගකිවයුතු එක අයෙක්වත් ජාතික ප්‍රශ්න කතා නොකරන නිසයි. එතන ඒ දේ වුනානම් අද මෙතන අපිට අයිති ප්‍රශ්න පමණත් කතාකරන්න තිබුණා. ඒ අපේ ප්‍රශ්න ගැන කතා කරන්න නොහැකිවීම ගැන කණගාටුවෙනවා.ජාතික තලයේ තිබෙන ප්‍රශ්න ටික විසදගන්න නම් මේ තිබෙන නිදහස සීමා කළයුතු වෙනවා කවුරු බලයට පත්වුනත්. අද රටේ නිදහස වැඩියි. අද මේ රටේ මාධ්‍ය නිදහස වැඩියි.

මෙතරම් මාධ්‍ය නිදහස තියාගෙන මේ රට ගොඩගන්න බැහැ. ඉස්සර ප්‍රවෘත්ති කිවුවේ එක තැනකින්. ආණ්ඩුවෙන් ප්‍රවෘත්ති කිවුවා. දැන් නාලිකා 10 ක ප්‍රවෘත්ති 10 යි. ප්‍රවෘත්ති කියලා ඉවරවෙලා තියන ආණ්ඩුව විවේචනය කරනවා. මධ්‍ය තුලින් ජනතාව හා පාලකයින් පිළිබඳ විශ්වාසය නැතිකර තිබෙනවා . ඊළගට වෘත්තීය සමිති. මේ දෙක තියාගෙන මේ රට හදන්න කිසිම නායකයෙතුට බැහැ. හරි මිනිහෙක් ඇවිත් ඒ දෙක තමන්ගේ අතට අරගෙන මේ රට හැදිය යුතුයි. මෙහි ප්‍රජාතන්ත්‍රවාදය වැඩියි. අද ජාත්‍යන්තර සම්මුතින් ,ළමා ප්‍රඥප්ති ,මානව හිමිකම් බදාගෙන අද පාසල් ළමයෙකුට ගහන්න බැහැ. ඉස්සර ළමයින්ට දිමි ගොටු දාලා ගැහුවා. ළමයින්ට ගහන්න ඕනැයි කියා මම කියන්නේ නැහැ. නමුත් ඒ හැදුනු ළමයි තමයි මේ රට පාලනය කරන්නේ.අද ළමයෙකුට ටොක්කක් ඇන්නොත් මානව හිමිකම්.වේවැලෙන් ගැහුවා කියා පොලිසියේ එක්කෙනෙක් මාරු කළා. කරන්ට් එක ඇල්ලුවා කිවුවා ,වාහන ඇතුලේ කරන්ට එක අල්ලන්න තිබුනේ මොකක්ද,මේවා සම්පුර්ණයෙන් ගොතපුවා.මේ රටේ අනාගතය,දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කරන්න හදපු දේවල්. මේවාට අපේ පාර්ලිමේන්තුවේ ඉන්න පාලකයෝ ඔක්කොම අහුවෙලා. මෙහි වරද ඇත්තටම කිසිම කෙනෙක් හෙව්වාද, අන්තිමට ළමයෙකුට ගහන්න වේවැලක් අතට ගන්න නැහැ. අධ්‍යාපනය සම්පුර්ණයෙන් මොට කරලා මේ රටේ අධ්‍යාපනය සම්පුර්ණයෙන් විනාශ කරන වැඩ පිලිවෙලක් යන්නේ.

පාරවල් ශුද්ධ කිරීම ගැන රාජු මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු ගණනාවක් කතා කළා. ඉස්සර මෙහෙම ඉලුක් තිබුනේ නැහැ. දැන් කපාගෙන යනවා මෝටර් ග්‍රේඩරයෙන්. ඊට පසු දිගටම වැස්සා. අපි මේ ගැන උපරිම කරන්න උත්සාහ කරනවා.

සේවකයින්ගේ විනය ගැන කතා කළා. අපි කළමනාකරණ රැස්වීම් තියාත් කතා කළා. මම මේ සම්බන්ධව තව දරටත් අවධානය යොමු තරනවා.

විදුලි සවිකිරීම් මන්ත්‍රීවරු කැමතිනම් සෙනසුරාදා දවසක දාලා විදුලි සවිකරන කණ්ඩායම් උපකාරියාල 4 ම එක මන්ත්‍රීවරයෙකුට දෙනවා. මන්ත්‍රීවරු වැඩයට බැසිය යුතුයි. මෙහි මන්ත්‍රීවරු කතාකරන තැනක් විතරයි. මුලු සභාවෙම මන්ත්‍රීවරු වැඩකරන සභාවක් වියයුතුයි. මෙතන තිබෙන සක්‍රිය දායකත්වය කතාවට දක්වන සැලකිල්ල ඉතිරි දවස 30 ම වැඩ සඳහාත් දායක වෙන්න කියා ඉල්ලනවා.

<u>ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා (එ.ජා.ප.)</u>
ගරු සභාපතිතුමනි, මෙය හරියන්න නම් ඔබතුමා මාසික නියාමන ව්‍යාපෘතියක් හැටියට මේ විදුලි කාර්මිකයෝ සම්පූර්ණයෙන් මන්ත්‍රීවරුන්ගෙන් නිදහස් කරන්න. ඒගොල්ලන්ට ඒ බලය දෙන්න.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීවරුනි,එවිට කොහොමවත් කෙරෙන්නේ නැහැ. විදුලිය සවිකිරීමේ වැඩ කටයුතු ඉදිරි මාස දෙකේ හෝ විධිමත් කර ක්‍රියාත්මත කරන්න කටයුතු කරනවා.

වෙන්දේසි ඉඩම් ගැන කතා කළා. අරගලය නිසා වෙච්ච දේවල් ගැන කතා කළා. මම අරගලයට පක්ෂත් නැහැ විපක්ෂත් නැහැ. හැම දෙයක් නිසාම අතුරුපල තිබෙනවා. මෙහි ලොකුම අතුරු ඵලය තමයි නීතිය වල්වැදුනා.
පොලිසියට මිනිසුන්ගේ භය,ගරුත්වය නැතිය ගියා.පොලිස් නිලධාරීන්ට ගහලා පාරේ මැරුවේ කවදද. පොලිසියට ඔය තත්වය ඇති කළාට ගෝඨභය රාජපක්ෂ මහතා වගකිවයුතුයි.ඔහු කළ ලොකුම වරද තමයි අරගලයට ඕන විදිහට නටන්න දුන් එක. අරගලයේ මේ රට විනශ කරපු කණ්ඩායම් සිටියා. දැන් මිනිස්සු අරගල ගණන් ගන්නේ නැහැ. ඕන එකටයි එපා එකටයි සැම එකටම පාරට බහින්න පටන් අරන්. මේ රටේ සල්ලි සහ දේපල අරගල නිසා සැමදාම විනාශ වෙනවා. මෙහි සීමාවක් තිබිය යුතුයි.ඉදිරියට මිනිස්සු අරගලවලට බහින්නෑ. අරගලවල අවසාන ප්‍රතිඵලය මිනිස්සු ස්වයංව ආණ්ඩුවලට විරුද්ධව නැගී සිටින එක නැතිවෙනවා. මෙයින් ලොකු හානියක් වෙනවා අනාගතයට.

අද දවසේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ කිවයුතු විශාල ප්‍රමාණයත් මෙතන කිවුවා. ඒවාට උත්තර දෙන්න ගියොත් මෙයත් පාර්ලිමේන්තුවබ වගේ වෙන නිසා. ඔබතුමන්ලා මේ අද කතා කරන්න දක්වපු උද්යෝගය වැඩ කරන්නත් සියලුදෙනා එකට එකුවෙන්න කියා ඉල්ලනවා විශෙෂයෙන් ආණ්ඩු පක්ෂයට.කමිටු සක්‍රිය කරගන්න. ඉදිරියේදී කමිටු දමා මහජන පැමිණලි කමිටු හරහා ක්‍රියාත්මක කරන්න ඉදිරියේදී බලාපොරොත්තුවෙනවා. නිලධාරීන්ට මහජන පැමිණිලිවලට ගියහම වෙන වැඩක් කරන්න වෙලාවක් නැහැ. එනිසා මහජන පැමිණිලි සඳහා වෙනම කමිටුවක් දමා මන්ත්‍රීවරුන්ට සක්‍රියව දායකවෙන්න කියා ඉල්ලීමක් කරනවා.ඒවාට මහජන නියෝජිතයෝ විදිහට සම්බන්ධවූ විට ප්‍රායෝගිකව විසදන්න ලේසියි.එනිසා ඒවටත් සම්බන්ධ වෙන්න කියා ඉල්ලමින් අද දවසේ දීර්ඝ වෙලාවක් සභා රැස්වීම කරගෙන යාමට සහයදුන් සිවඑදෙනාටම ස්තුතිවන්ත වෙමින් අද දින වැඩ කටයුතු මෙයින් අවසන් කරනු ලබනවා.

2022.11.10 දින
දොම්පෙ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය
කිරිඳිවැල.

සභාපති
දොම්පෙ ප්‍රාදේශීය සභාව.